සැ. යු.- 2012.04.11 දින පළ වූ අංක 1,754 දරන ගැසට් පත්‍රයේ I-III සහ IV(අ)කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,755 - 2012 අප්‍රේල් මස 20 වැනි සිකුරාදා - 2012.04.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 494 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 495 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අප්‍රේල් මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අප්‍රේල් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කිලිනොච්චි දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 මැයි මස 21 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 මාර්තු මස 27 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3හි,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කිලිනොච්චි | පච්චිලයිපල්ලි (පලයි) | මුල්ලිපත්තු කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා පච්චිලයිපල්ලි කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | උප දිසාපති/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිලිනොච්චි. |

04-427

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 මැයි මස 21 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 මාර්තු මස 30 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3හි
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කෑගල්ල | මාවනැල්ල | ගල්බඩ කිණිගොඩ කෝරළය කොට්ඨාසයේ (කිරිංගදෙනිය ප්‍රදේශය) මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කෑගල්ල | රුවන්වැල්ල | කෝරළතුන හා පාතබුලත්ගම කොට්ඨාසයේ (කන්නත්තොට ප්‍රදේශය) මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |

04-508

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 මැයි මස 21 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 මාර්තු මස 30 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3හි,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගම්පහ | මීගමුව | මීගමුව (රෝහලින් පිට) නගර කොට්ඨාසයේ අතිරේක වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |
| ගම්පහ | ජා-ඇල | දකුණු අළුත්කුරු කෝරළය කොට්ඨාසයේ රාගම ප්‍රදේශයේ, විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගම්පහ |

04-507

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට ආධුනිකයින් ඇතුළත් කරගැනීම - 2012 වර්ෂය

රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට 2012 වර්ෂය සඳහා ආධුනික/ආධුනිකාවන් ඇතුළත් කරගැනීම පිණිස මෙහි දෙවන ඡේදයේ සඳහන් අවම සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *අවම සුදුසුකම් :*

(අ) වයස : 2012.05.31 දිනට අවුරුදු 16ත් 25ත් අතර විය යුතුය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :-

සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා විද්‍යාව ඇතුළු විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම. 2011.12.31 දිනට කලින් අධ්‍යාපන සුදුසුකම් ලබා සිටීමත්, පළමු වාරයේ දී විෂයයන් 05කින් සමත්වී සිටීමත් අවශ්‍ය වේ.

03. *පුහුණු පාඨමාලා :*

ආධුනික පුහුණුවට තෝරාගනු ලබන ආධුනිකයින්ට පහත සඳහන් වෘත්තීන් හා එම වෘත්තීන්ට අදාළ කාලසීමාවට යටත්ව පාඨමාලාව හැදෑරීමට ඉඩ සලසනු ලැබේ. පාඨමාලාව පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි. පහත සඳහන් පාඨමාලා සඳහා 25 දෙනා බැගින් තෝරා ගනු ලැබේ. :—

(i) ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පී අවු. 02 1/2
(ii) පැස්සුම් ශිල්පී අවුරුදු 03
(iii) විදුලි ශිල්පී (බල) අවුරුදු 03 1/2
(iv) යන්ත්‍ර ශිල්පී (සාමාන්‍ය) අවුරුදු 03 1/2

04. *අයදුම්පත් :*

අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව යතුරු ලියන කඩදාසියක (ඒ-4) පිළියෙල කරගත් අයදුම්පත්වල සම්පූර්ණ විස්තර නිවැරදිව සඳහන් කළ යුතුය. අවශ්‍ය සම්පූර්ණ තොරතුරු සඳහන් නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. *පාඨමාලා සඳහා තෝරා ගැනීම :*

(1) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ මගින් සිදු කරන අතර, අවශ්‍ය අවම සුදුසුකම් ඇති හා 07 වැනි ඡේදයේ සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(2) ලිඛිත පරීක්ෂණය ගණිතය, මූලික කාර්මික දැනුම හා සාමාන්‍ය දැනීම පදනම් කරගෙන පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලා පදනම යටතේ ප්‍රායෝගික/සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

(3) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවල දී වැඩිම මුළු ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලා සඳහා තෝරාගනු ලැබේ.

06. *විභාග මාධ්‍ය :-*
විභාග මාධ්‍යයන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි වේ.

07. *විභාග ගාස්තු :-*
මෙම විභාගය සඳහා ආපසු නොගෙවනු ලබන රු. 500 ක විභාග ගාස්තුවක් අයකෙරේ. එම ගාස්තුව මරදාන තැපැල් කාර්යාලයෙන් ලබාගැනීමට හැකිවන පරිදි දුම්රිය සාමාන්‍යාධිකාරී නමට ලියූ මුදල් ඇණවුමකින් එවිය යුතුය. එසේ ලබාගත් මුදල් ඇණවුම අයදුම්කරුවන් විසින් එවනු ලබන ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුය. මුදල් ඇණවුම අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුළත් වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැළකිය යුතුය.

08. *විභාග මධ්‍යස්ථාන :*
සියලුම අවශ්‍යතා සම්පූර්ණ කරන අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් කොළඹ මධ්‍යස්ථානයක දී පමණක් පැවැත්වේ.

09. *ගිවිසුම අත්සන් කිරීම :*

ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් වෘත්තියට අදාළ කාල සීමාවන් තුළ පුහුණුව සාර්ථකව හදාරන බවට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ ගිවිසුමකට අත්සන් තැබිය යුතුය.

10. පුහුණුව ලබන කාලය තුළ ආධුනිකයින්/ආධුනිකාවන් සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මගින් මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

11. පුහුණුවෙන් පසු ආධුනිකයිනට රැකියා ලබා දීමට දෙපාර්තමේන්තුව බැඳී නැත.

12. පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත් පෝරමය අනුව අයදුම්පත් පිළියෙළ කර "අධ්‍යක්ෂ ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථාන, කල්දේමුල්ල පාර, රත්මලාන" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "ශ්‍රී ලංජදුකාඅම/2012" යනුවෙන් සඳහන් කළ යුතුය.

13. *අයදුම්පත් භාරගන්නා අවසන් දිනය :-*
අයදුම්පත් 2012.06.30 වැනි දින තෙක් භාරගනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. එම්. ජී. එන්. ධර්මසේකර,
අතිරේක දුම්රිය සාමාන්‍යාධිකාරී (පරිපාලන)
*දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.*

2012 ජනවාරි මස 24 වැනි දින,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
කොළඹ 10.

**ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට ආධුනිකයින් බඳවා ගැනීම - 2012**

01. නම සම්පූර්ණයෙන් (වාසගම සමඟ) සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් ලියන්න. :————.
02. ලිපිනය (සිංහලෙන්) :————.
(ඉංග්‍රීසියෙන්) :————.
03. දිස්ත්‍රික්කය :————.
04. උපන්දිනය :————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :
06. අධ්‍යාපන සුදුසුකම් :-අ. පො. ස. (සා/පෙළ) :-

පළමුවර :————. විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |

දෙවැනිවර :————. විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |
| ........................ | ........................ |

07. අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍ය :————.

08. දැන්වීම් අනුව තමා කැමති වෘත්තීන් දෙකක් අනුපිළිවෙළින් සඳහන් කරන්න.

1. ————.

2. ————.

09. තැපැල් කාර්යාලයකට රු. 500ක් ගෙවා ලබා ගන්නා ලද අංක ……… දරන මුදල් ඇණවුම/මෙයට අමුණා ඇත.

10. ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි. මෙහි සහතික කරන ලද විස්තරවලින් යමක් අසත්‍ය බව මා තෝරාගැනීමට කලින් පෙනී ගියහොත් එයින් මම නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු පෙනී ගියහොත් පුහුණුවෙන් ඉවත් කර දමනු ලැබීමටත් හැකිවන බව දනිමි.

————,

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

04-426

---

## ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවැනි හා දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවැනි හා දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2012 ජුනි මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණය සඳහා අයැදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2012.05.18 වැනි දින බවට මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලබන අතර, ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයැදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ අයැදුම්පත්‍රය අනුව අපේක්ෂකයන් විසින් ඒ4 ප්‍රමාණයේ කඩදාසියක අංක 01 සිට 04 (ii) තෙක් විස්තර මුල් පිටුවේ ද සෙසු කොටස් දෙවැනි පිටුවේ ද ඇතුළත් කර තම අයැදුම්පත සකස් කරගත යුතුය. අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විසින් සිය අත් අකුරිනි. තව ද අයැදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල භාෂා ඉල්ලුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ භාෂා ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතුය. ආදර්ශ අයැදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර, අයැදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයැදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමුවැනි හා දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම පෙනී සිටීමට අපේක්ෂා කරන්නේ නම් ඒ බව නිවැරදිව සඳහන් කළ ඉල්ලුම්පත්‍ර දෙකක් ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයේ ඉහළින් ඇති තොරතුරු සහ අදාළ පරිදි 7 (i) හෝ (ii) තොරතුරු නිවැරදිව සඳහන් කළ යුතුය. තව ද විභාග දෙක (02) සඳහා වන විභාග ගාස්තු වෙන් වෙන් වශයෙන් ගෙවා ලදුපත් දෙකක් ලබාගෙන ඉල්ලුම්පත්‍ර දෙකට ඇලවිය යුතුයි.

03. අයැදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් (*උදා*. : ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි නම් ප්‍රාදේශීය ලේකම් මගින්) 2012.05.18 දින හෝ ඊට පෙර, බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල් යන ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයැදුම්පත්‍රය විභාග කොමසාරිස් ජනරාල් වෙත බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයැදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සඳහා වන අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා නව ප්‍රවේශක නිලධාරීන් විසින් තම අයැදුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍යය අනුව දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් හෝ පිළියෙල කොට ඉදිරිපත් කළ හැකිය.

04. අයැදුම්පත්‍ර පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපත සමග ප්‍රවේශ පත්‍රය නිකුත් කරනු ඇත. අපේක්ෂකයන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබී ඇත්නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ඔබ භාරයේ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත. :—

(i) විභාගයේ නම :————,

(ii) අයැදුම්කරුගේ සම්පූර්ණ නම :————,

(iii) සම්පූර්ණ ලිපිනය :————,

(iv) ඉල්ලුම් පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය :————,
ලියාපදිංචි අංකය සහ දිනය :————.

05. *අනන්‍යතාව* :

අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතරින් එකක් පමණක් භාර ගැනේ. :—

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයක.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයැදුම්කරුවකුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හෝ නොපිළිගැනීමට හෝ විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

06. *විභාග ගාස්තු* :

මෙම විභාගයට පෙනී සිටින විභාග අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කෙරේ :—

*විභාග ගාස්තු* :

(*අ*) පළමුවැනි වතාව සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙක වෙනුවෙන් ගාස්තු අය නොකෙරේ.

(*ආ*) පළමුවැනි වතාවෙන් පසු එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා රු. 400 ක් බැගින් අය කෙරේ.

(*ඇ*) එක් විෂයයක් සඳහා රු. 150 ක් අය කෙරේ.

අදාළ විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ, එහි දාරයක් නොගැලවෙනසේ අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම ඉල්ලුම් කරන්නේ නම් විභාග ගාස්තු වෙන වෙනම ගෙවූ ලදුපත් දෙකක් ලබාගෙන අදාළ ඉල්ලුම්පත්‍රවල ඇලවිය යුතු වේ.

07. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් කෙරේ. මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (IIඅ) ඡේදය ආරම්භයේ පළ කරනු ලැබ ඇති විභාග අපේක්ෂකයන් සඳහා නීතිරීති මේ විභාගය සඳහා ද බල පැවැත්වේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

08. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර ඇති තමන්ගේ දෙපාර්තමේන්තු/කාර්යාලවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තු/කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබාදිය යුතුය. ඉල්ලුම්පත්‍ර යොමුකළ සියලුම අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබන අතර, අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළකරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේ දී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

11. පළමුවැනි හා දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා අදාළ වන විෂය නිර්දේශයන් පහත දක්වා ඇත.

### *ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය*

01. පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත. :-

| | | |
|---|---|---|
| (i) | ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන | - ලකුණු 100 යි (විෂය අංක - 01) |
| (ii) | ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය | - ලකුණු 100 යි (විෂය අංක - 02) |
| (iii) | ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම | - ලකුණු 100 යි (විෂය අංක - 03) |
| (iv) | ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍යක්‍රම | - ලකුණු 100 යි (විෂය අංක - 04) |
| (v) | ඉංග්‍රීසි භාෂාව | - ලකුණු 100 යි. (විෂය අංක - 05) |

02. සේවා ව්‍යවස්ථාවේ හා පත්වීම් ලිපියේ විධිවිධාන පරිදි නියමිත කාල සීමාව තුළ හෝ ඊට පෙර විභාගය සමත් විය යුතු අතර, සියලුම විෂයයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියකුට අවසර ඇත.

03. සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම කාලය පැය 03කි.

04. ප්‍රශ්න පත්‍රයක ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

05. සාමාර්ථය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින්ම ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුවේ.

### *විභාග පරිපාටිය*

*පළමුවැනි පත්‍රය* - ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන :

(i) ජාතික පරමාර්ථයන් හා ප්‍රමුඛතාවන් සහ ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රමසම්පාදන ප්‍රතිපත්ති රාමුව සහ වැඩසටහන්
(ii) ජාතික ක්‍රමසම්පාදනය සඳහා විධි ශාස්ත්‍රය ක්‍රමසම්පාදනයෙහිලා ප්‍රධාන ගැටලු තැන්, පොදු ජන සහභාගිත්වය, සම්පත් යෙදවීම ආදිය.
(iii) ජාතික ක්‍රමසම්පාදනය සඳහා දත්ත ස්වභාවය සහ මූලාශ්‍ර, දත්ත රැස්කිරීම, අර්ථ නිරූපනය ඉදිරිපත් කිරීම සහ විශ්ලේෂණය, ක්ෂේත්‍ර අධීක්ෂණ හා විමර්ශන ජනවිකාශ සංකල්ප, ආර්ථික විද්‍යා ප්‍රක්ෂේපණ හා ප්‍රතිපත්ති විශ්ලේෂණ.

*දෙවැනි පත්‍රය - ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය* :

(i) නිපැයුම හා බෙදාහැරීම පිළිබඳ න්‍යායයන් කෙරෙහි විශේෂ සැලකිල්ලකින් යුතුව ආර්ථික විද්‍යා මූල ධර්ම.
(ii) මුදල්, බැංකු ක්‍රම, ජාත්‍යන්තර මූල්‍ය ක්‍රම හා වෙළඳාම.
(iii) මූල්‍ය, මුදල්, වෙළෙඳ හා තීරුබදු ප්‍රතිපත්ති විශ්ලේෂණය.
(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය.
(v) ආර්ථිකය සමාලෝචනය කිරීම.
(vi) ශිල්පීය පුහුණු සහ නුපුහුණු මිනිස් බලය සහ විදේශාධාර ඇතුළු වෙනත් සම්පත් තක්සේරු කිරීම සහ ඒවා උපයෝගීකරණය.
(vii) ආර්ථික, විද්‍යාත්මක සහ සමාජයීය සිද්ධි.
(viii) ආර්ථික විශ්ලේෂණය සහ ක්‍රමසම්පාදනයෙහිලා උපයෝගී කර ගන්නා මූලික සංඛ්‍යාන සංකල්ප හා ක්‍රම.
(ix) ප්‍රතිලාභ/පිරිවැය විශ්ලේෂණ මූලධර්ම.

*තුන්වැනි පත්‍රය.—ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණ සහ පසුවිපරම් කටයුතු* :

(i) ව්‍යාපෘති සැලසුම් කිරීම, හඳුනා ගැනීම සහ නිර්වචනය කිරීම හා ව්‍යාපෘති සම්පාදනය, ප්‍රතිපත්ති, සිද්ධාන්ත, ස්ථානය තෝරා ගැනීම, තාක්ෂණය සහ පිරිවැය සහ ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම, තාක්ෂණික මූල්‍ය සහ ආර්ථික විශේලේෂණය.

(ii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම/අධීක්ෂණය, ව්‍යාපෘති සහ වැඩසටහන් නිසියාකාරව සහ කාලීනව ක්‍රියාත්මක කිරීම, සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ උපලේඛන සැකසීම, පසුවිපරම් සහ ප්‍රගති පාලනය සම්බන්ධීකරණය සහ ඉදිරි කටයුතු.

(iii) ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘතිවල සහ වැඩසටහන්වල සාකල්‍යය තක්සේරු කිරීම, පිරිවැයට සාපේක්ෂව ප්‍රතිලාභ විශ්ලේෂණය.

හතරවැනි පත්‍රය.—ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ක්‍රම :

(i) ආණ්ඩුවේ මුදල් රෙගුලාසි I වැනි කාණ්ඩය (X වැනි පරිච්ඡේදය හැර)
(ii) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, IX, XI, XII, XV, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති පළමුවැනි කාණ්ඩයේ I සිට VI දක්වා පරිච්ඡේද

(iii) *ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය.*—රාජ්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන, රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය, ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරිත්වය, විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම, රාජ්‍ය ආදායම, මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය, භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය, වොරන්ට් සහ අග්‍රිම අධිකාරිය, විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්යභාරය, රාජ්‍ය ව්‍යාපාර කමිටුව

(iv) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ ගිණුම් නිලධාරීන් පත්කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්ය භාරය

(v) රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණය, සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනා ගැනීම, වාර්ෂික ආදායම් හා ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම, අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම, වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය, පරිපූරක ඇස්තමේන්තු

(vi) *රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය.*—භාණ්ඩ, සේවා හා වැඩ ලබා ගැනීම, ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටුවල සංයුතිය, පත්කිරීම්, බලතල හා කාර්යභාරය, ලංසු ඇගයීමේ ක්‍රියා පටිපාටිය, විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල කළමනාකරණය

*පස්වැනි පත්‍රය.*—ඉංග්‍රීසි භාෂාව

ක්‍රමසම්පාදනය, සංවර්ධනය, සැලසුම්කරණය සහ කළමනාකරණය යන විෂයයන්ට අදාළව අපේක්ෂකයින්ගේ අධ්‍යාපනික හා වෘත්තීය ඉංග්‍රීසි භාෂා කුසලතාවය මැනීම සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

***ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය***

01. දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

(i) සංවර්ධන සැලසුම් ශිල්ප ක්‍රම - ලකුණු 100 යි (විෂය අංක - 06)
(ii) මූලික සාර්ව ආර්ථික විද්‍යාව - ලකුණු 100 යි (විෂය අංක - 07)
(iii) වර්තමාන ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම - ලකුණු 100 යි (විෂය අංක - 08)

02. සියලුම විෂයයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියකුට අවසර ඇත.

03. සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම කාලය පැය 03 කි.

04. ප්‍රශ්න පත්‍රයක ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

05. සාමාර්ථය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින්ම ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුවේ.

**විභාග පරිපාටිය**

(i) සංවර්ධන සැලසුම් ශිල්ප ක්‍රම
  (අ) ස්වොට් විශ්ලේෂණය (SWOT)
  (ආ) ගැටලු වෘක්ෂය
  (ඇ) තර්ක රාමු විශ්ලේෂණය
  (ඈ) පිරිවැය - ප්‍රතිලාභ විශ්ලේෂණය
  (ඉ) පිලි ලදුව ක්‍රමවේදය
  (ඊ) ශුද්ධ වර්තමාන අගය
  (උ) අභ්‍යන්තර ඵලදා අනුපාතය
  (ඌ) ඡායා මිල යොදා ගැනීම

(ii) මූලික සාර්ව ආර්ථික විද්‍යාව
  (අ) ජාතික ගිණුම්
  (ආ) ආර්ථික වර්ධන වේගය
  (ඇ) සමතුලිත ජාතික ආදායම
  (ඈ) ගුණිත ප්‍රතිවිපාකය
  (ඉ) උද්ධමනය
  (ඊ) පොළී අනුපාතය
  (උ) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ හැඳින්වීමක්
  (ඌ) මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ හැඳින්වීමක්
  (එ) වෙළඳ චක්‍ර

(iii) වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම

  (අ) වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම (ඒ ඒ අවස්ථාවේ ඇතිවන ලෝක ආර්ථික තත්ත්වයන්ට කාලීනව ගැළපෙන මාතෘකා ඔස්සේ පිළිතුරු සැපයීමට සිදුවේ.)

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ 01, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

*අයදුම්පත්‍රය*

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවැනි හා දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012
FIRST AND SECOND EFFICIENCY BAR EXAMINATIONS FOR OFFICERS IN GRADE III OF THE SRI LANKA PLANNING SERVICE - 2012

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාල අංකය කොටුව තුල ලියන්න)

සිංහල - 2
දෙමළ - 3 (ඉල්ලුම් කළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට
ඉංග්‍රීසි - 4 ඉඩ දෙනු නොලැබේ.)

ඉල්ලුම්කරන කාර්යක්ෂමතා කඩඉම් විභාගය : ☐
පළමුවැනි - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
දෙවැනි - 2

(ගැසට් නිවේදනයේ 02 වැනි ඡේදය බලන්න. විභාග දෙක සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.)

01. නම :

1.1 මුල්'කුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) - උදා : SILVA, B. A.

1.2 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

02. කාර්යාලයීය ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 කාර්යාලයීය ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. 3.1 ස්ත්‍රී/පුරුෂභාවය ස්ත්‍රී - 1 ☐
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය: ☐☐

3.3 ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින :

04. ගැසට් නිවේදනයේ 10 වැනි ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයයන් : (එක් ඉල්ලුම්පත්‍රයක සම්පූර්ණ කළ යුත්තේ ඉල්ලුම් කරන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ 04 (i) හෝ 04 (ii) හෝ පමණි)

04. (i) පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම :

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| ........................ | ☐ |
| ........................ | ☐ |
| ........................ | ☐ |
| ........................ | ☐ |
| ........................ | ☐ |

04. (ii) දෙවැනි කාර්යක්ෂමතා කඩඉම :

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| ........................ | ☐ |
| ........................ | ☐ |
| ........................ | ☐ |

05. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III වැනි ශ්‍රේණියට ඇතුළත් වූ දිනය :————.
*(නිත්‍ය වශයෙන් රාජකාරි භාරගත් දිනය සඳහන් කළ යුතු ය.)*

06. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදී ප්‍රවේශකයෙක් ද? නැතහොත් නව ප්‍රවේශකයෙක් ද? :————.

07. දෙපාර්තමේන්තුවේ නම : (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නම් එම කාර්යාලයේ නම) :————.

08. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

09. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු :

| *ලදුපත නොගැළවෙන සේ හොඳින් අලවන්න.*<br>*(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)* |
|---|

10. ඉහත සඳහන් විස්තර නිවැරදි බව ද, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බව ද ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන.*—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකුගේ, තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිට දී අයදුම්කරු අත්සන් කළ යුතු ය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිණියක වූ, මා පෞද්ගලිකව දන්නා හඳුනන ........................... මහතා/මහත්මිය/මෙනෙවිය ................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.

————,
සහතික කරන්නාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,
(ii) අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
*(නිල මුද්‍රාව තැබිය යුතුය)*

තනතුර :————.

දිනය :————.

04-420

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2011 (2012)**

ඉහත සේවාවේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2012 සැප්තැම්බර් මස ආරම්භ කොට පේරාදෙණියේ දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2011 වසරේ දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ සිටි නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර ඉදිරිපත්වීමට හැකි වන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. *විෂය නිර්දේශ .*— I වැනි හා II වැනි කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග I සඳහා වන විෂය නිර්දේශ ඇමුණුම "අ" හි ද කාර්යක්ෂමතා කඩඉම් II සඳහා වන විෂය නිර්දේශය "ආ" හි ද සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය :

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය

| *I වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය* | | | *II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය* | | |
|---|---|---|---|---|---|
| *විෂයය අංකය* | *විෂයය* | *කාල සීමාව (පැය)* | *විෂයය අංකය* | *විෂයය* | *කාල සීමාව (පැය)* |
| 01 | මුල්‍ය ක්‍රම | 03 | 01 | කොටස් 01 | 03 |
| 02 | පරිපාලනය | 03 | 02 | කොටස් 02 | 03 |
| 03 | දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය - I | 02 | 03 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය I | 03 |
| 04 | දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය - II | 03 | 04 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය II | 03 |
| 05 | විශේෂ ප්‍රශ්න පත්‍රය* | 03 | 05 | කොටස් 03- ප්‍රශ්න පත්‍රය III | 03 |
| | | | 06 | කොටස් 03- ප්‍රශ්න පත්‍රය IV | 03 |
| | | | 07 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය V | 03 |
| | | | 08 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VI | 03 |
| | | | 09 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VII | 03 |
| | | | 10 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VIII | 03 |
| | | | 11 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය IX | 03 |
| | | | 12 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය X | 03 |
| | | | 13 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය XI | 03 |

* *මේ සඳහා අයැදුම් කළ යුත්තේ පශු පර්යේෂණ නිලධාරීන් පමණි.*

*සටහන.*—II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ අයදුම්කරුවන් පෙනී සිටිය යුත්තේ කොටස් 01 හෝ කොටස් 02 යන ප්‍රශ්න පත්‍ර දෙකින් එකකට හා 03 හි සඳහන් ප්‍රශ්න පත්‍ර XI න් ප්‍රශ්න පත්‍ර දෙකකට පමණි. සාමාර්ථ්‍යය සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතු ය.

05. පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුල්වීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම් ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාවය.

06. මෙම විභාගය සඳහා සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් උත්තර සැපයීමට අපේක්ෂකයින්ට හැකිවනු සඳහා විභාග කොමසාරිස් ජනරාල් විධිවිධාන සලස්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගවලට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍ර, අමුණා ඇති ආකෘතියට අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතු ය. **ඉහත සඳහන් පරීක්ෂණ දෙකටම පෙනී සිටින්නේ නම් වෙන වෙනම එක් එක් විභාගයන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.** ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුවේ. ඊට අදාල තොරතුරු තම අත් අකුරින්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුවේ. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත් අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. ඉල්ලුම්පත්‍ර 2012 ජූනි මස 29 වැනි දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

"සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ, පේරාදෙණිය."

11. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සළකා බලනු නොලැබේ.

13. හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති 1971 ජූනි මස 29 වැනි දින අංක එස්ඊ 274 දරන චක්‍රලේඛය කෙරෙහි සියලුම අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරනු ලැබේ. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වනු ඇත. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණකි.

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත :

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

| | | |
|---|---|---|
| (ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා— | රු. | ශත |
| සම්පූර්ණ විභාගය සඳහා | 1,000 | 0 |
| එක් විෂයයකට | 500 | 0 |

මෙම විභාගයට දැනටමත් පෙනී සිටි අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක ඇලවිය යුතු ය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැක.

15. අපේක්‍ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

කේ. එම්. ටී. කැඳරාගම,
ලේකම්,
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය.

2012 මාර්තු මස වැනි දින,
අංක 45, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

***ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2011 (2012)***

Efficiency Bar Examination for the Officers in Sri Lanka
Animal Production and Health Service — 2011 (2012)

(විභාගයේ නම ලිපිකවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)

(කාර්යක්ෂමතා කඩඉම් විභාග 02 ටම එකවර පෙනී සිටින්නේ නම් ඒ සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර 02ක් එවිය යුතුය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදාල අංකය කොටුව තුළ ලියන්න.)

නිලධාරියා ඉල්ලුම්කරන විභාගය : (අදාල අංකය කොටුව තුළ ලියන්න.)

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 1
දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2

01. (අ) මුල'කුරු අගට යොදා මුල'කුරු සමඟ නම :———.
(උදා :- Nimalsiri K.A.)

(ආ) මුල'අකුරුවලින් හැඳින්වෙන නම් :———.

02. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

03. පදවි නාමය :———.
දෙපාර්තමේන්තුවේ නම :———.

04. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) :———.

05. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත් කරන ලද දිනය :———.

06. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිලිව සඳහන් කළ යුතුය.) :

(i) විෂය අංකය : ☐☐ විෂයය :———.
(ii) විෂය අංකය : ☐☐ විෂයය :———.
(iii) විෂය අංකය : ☐☐ විෂයය :———.
(iv) විෂය අංකය : ☐☐ විෂයය :———.
(v) විෂය අංකය : ☐☐ විෂයය :———.

07. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විෂයයන් ද වර්ෂය හා මාසය ද සඳහන් කරන්න. :———.

08. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහලින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

09. ගෙවන ලද විභාග ගාස්තුව : රු. :———.

| |
|---|
| ලදුපත ඇලවීම සඳහා<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |

———,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :———.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මගින්
විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

* අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
පදවි නාමය.

දිනය :———.

(*ගාස්තුව නොගෙවන විටදී කපා දැමිය යුතුය)

"අ" ඇමුණුම

(අ) ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ :—

1. මූල්‍ය ක්‍රම;
2. පරිපාලනය;
3. දෙපාර්තමේන්තු රෙගුලාසි - I
4. දෙපාර්තමේන්තු රෙගුලාසි - II

**1. මූල්‍ය ක්‍රමය**

මූල්‍ය ක්‍රම පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :-

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවේ මුදල් රෙගුලාසි සංග්‍රහය ( X වැනි පරිච්ඡේදය හැර)

* සටහන : සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

**2. පරිපාලනය**

පරිපාලනය පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :—

(අ) කාර්යාල ක්‍රම, කාර්යාල කළමනාකරණය හා කාර්යාල සංවිධානය කිරීම පිළිබඳ දැනුම;

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති මාලාව මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ I, II, III, V, VI පරිච්ඡේද සහ ආයතන සංග්‍රහයේ VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XIX, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII පරිච්ඡේද

* සටහන.—සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40%ක් අපේක්ෂකයකු විසින් ලබා ගත යුතුය.

**3. දෙපාර්තමේන්තු රෙගුලාසි - I**

දෙපාර්තමේන්තු රෙගුලාසි පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :—

මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂයයන්ගෙන් සමන්විත පැය 02 ක ප්‍රශ්න පත්‍රයකි. සත්ත්ව පනත, සත්ත්ව රෝග පනත හා ආනුෂාංගික රීති දෙපාර්තමේන්තු නියෝග හා පශු වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ චක්‍රලේඛ.

* සටහන.- සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

**4. දෙපාර්තමේන්තු රෙගුලාසි - II**

මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂයයන්ගෙන් සමන්විත පැය 03ක ප්‍රශ්න පත්‍රයකි :—

(අ) නිදර්ශක බෙදාහැරීම, පශ්චාත් මරණ පරීක්ෂණ ඇතුළු රසායනාගාර හඳුනාගැනීම්, ගැබ් පරීක්ෂාව ඇතුළු හඳුනාගැනීම් පරීක්ෂණ, බෝවන රෝග හා ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා එන්නත් හා මස්තු පරීක්ෂාව;

(ආ) කෘත්‍රිම සිංචන ක්‍රමවේදය හා එහි භාවිතය, වසුපැටවුන් බෝකිරීම හා ඇතිදැඩි කිරීමේ මූලධර්ම, බීජෞෂනය මගින් පැටවුන් ලබාගැනීම හා ඇතිදැඩිකිරීම, සත්ත්ව පෝෂණය, පශු සම්පත් සඳහා ආහාර වේල හා එහි භාවිතය, පෝෂ්‍ය තෘණ වගාව, වියළි තෘණ සහ සයිලේජ් සැකසීම හා පශු සම්පත් කළමනාකරණය;

(ඇ) කිරි නිෂ්පාදනය, පැස්චරීකරණය කරන ලද කිරි බෝතල් කිරීම හා ප්‍රවාහනය, කිරිවල සෞඛ්‍ය ආරක්ෂිත බව, කිරිවල බැක්ටීරියා, මේදය, කිරි විශ්ලේෂණය ඇතුළුව පරීක්ෂා කිරීම, යොදය වෙන් කිරීම, බටර්, ගිතෙල් හා මී කිරි නිෂ්පාදනය;

(ඈ) ඝාතනාගාර, සතුන් ඝාතනය කිරීම, මාංශ හඳුනාගැනීම් ඇතුළුව මාංශ පරීක්ෂා කිරීම.

* සටහන.- සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40%ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

ඇමුණුම ''ආ''

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ II වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ :—

1 කොටස : මෙම විෂය නිර්දේශයේ, 2 : 1, 2 : 2, 4 : 1, 4 : 2, 5 : 2, 5 : 8, 6 : 5, 7 : 2 : 1, 8 : 2, 8 : 2 : 2, 8 : 2 : 3, 8 : 3 : 1, 9 : 2, 9 : 4, 9 : 6, 9 : 7 කොටස්වලින් සමන්විත වේ. විෂය නිර්දේශය පේරාදෙණිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියලුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගත හැකිය.

2 කොටස : මෙම විෂය නිර්දේශයේ 1 : 1 : 1, 1 : 1 : 4, 1 : 2 : 1, 3 : 2, 3 : 1 : 1, 3 : 1 : 2, 3 : 2 : 1, 10 : 1 : 1, 10 : 1 : 2, 10 : 1 : 3, 10 : 1 : 4, 10 : 1 : 6, 10 : 2 : 1, 10 : 2 : 8 හා 10 : 4 : 1 කොටස්වලින් සමන්විත වේ. විෂය නිර්දේශය පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියලුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබා ගත හැකිය.

| | | | |
|---|---|---|---|
| 3 කොටස : | ප්‍රශ්න පත්‍රය I | - | ව්‍යාධි විද්‍යාව |
| | ප්‍රශ්න පත්‍රය II | - | පශු සම්පත් ආර්ථික විද්‍යාව |
| | ප්‍රශ්න පත්‍රය III | - | පශු මහජන සෞඛ්‍යය |
| | ප්‍රශ්න පත්‍රය IV | - | කෘෂි ව්‍යාප්තිය |
| | ප්‍රශ්න පත්‍රය V | - | ජාන විද්‍යාව හා අභිජනනය |
| | ප්‍රශ්න පත්‍රය VI | - | සත්ත්ව කායික විද්‍යාව හා ප්‍රජනනය |

| | | |
|---|---|---|
| ප්‍රශ්න පත්‍රය VII | - | සත්ත්ව නිවාසකරණය හා කළමනාකරණය |
| ප්‍රශ්න පත්‍රය VIII | - | සත්ත්ව පෝෂණය |
| ප්‍රශ්න පත්‍රය IX | - | තෘණ හා ගෝචර තෘණ |
| ප්‍රශ්න පත්‍රය X | - | ව්‍යවහාරික පශු ක්ෂුද්‍රජීව විද්‍යාව හා ප්‍රතිශක්තිකරණ විද්‍යාව |
| ප්‍රශ්න පත්‍රය XI | - | ව්‍යවහාරික, වෛද්‍ය විද්‍යාව, ව්‍යාධිවේදය හා පරපෝෂිතවේදය |

* සටහන : සාමාර්ථ්‍යය සඳහා මුළු ලකුණුවලින් 40% ක් අපේක්ෂකයකු විසින් ලබාගත යුතුය.

විස්තර පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියලුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබා ගත හැකිය.

04-480

---

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණිය තනතුර සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගයට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්" සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙලවරේ "සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණිය තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

(අ) *ඉල්ලුම්පත්‍ර* - අයදුම්පත් කැඳවන අවසාන දිනය 2012.05.18 වැනි දින වේ.

2012 ජුලි මස විභාගය පැවැත්වීමට නියමිතය.

*සටහන :-* ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(02) *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*
තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

(03) *වයස් සීමාව :-*
අවුරුදු 21 ත් 35 ත් අතර විය යුතුය.

(04) *වැටුප් පරිමාණය :-*
II ශ්‍රේණිය (MN 5-2006-A)
රු. 16,720 - 10 x 320 - 11 x 365 - 15 x 450 - රු. 30,685

(05) *අධ්‍යාපන සුදුසුකම් :-*
සංඛ්‍යානය, ගණිතය, ආර්ථික විද්‍යාව, පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, ප්‍රජා විද්‍යාව, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව යන විෂයන්ගෙන් අවම වශයෙන් එක් විෂයක් අන්තර්ගත වූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ උපාධියක් තිබිය යුතුය.

(06) *කායික සුදුසුකම් :-*

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

(ii) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත අය විය යුතුය.

(07) *වෙනත් :-*
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

08. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය.:-*
රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා සුදුසුකම් ලත් අය ලිඛිත විභාගයකට භාජනය කිරීමෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා අදාල පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දෙනු නොලැබේ.

(සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ විෂය නිර්දේශය අංක 09.1 යටතේ දැක්වේ).

09. *ලිඛිත තරග විභාගය :-*
පහත සඳහන් විෂයයන් ඇතුලත් වන සේ ලිඛිත ප්‍රශ්න පත්‍ර මගින් කුසලතාව පරීක්ෂා කොට වැඩිම ලකුණු ලබා ගන්නා අය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. ලිඛිත විභාගයකින් සුදුසුකම් ලැබීමට අවම වශයෙන් එක් විෂයයකින්

ලකුණු 40% ක් ලබා තිබිය යුතුය. ලිඛිත විභාගය හා සම්මුඛ පරීක්ෂණය පදනම් කොට පත්වීම් කරනු ලැබේ.

*විභාගයේ විෂයයන්* :- (විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය.)

(i) බුද්ධි පරීක්ෂණය
(ii) සාමාන්‍ය දැනීම

09.1 සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ විෂය නිර්දේශය—

(i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

(ii) විභාග ක්‍රමයඃ-
* විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ.
* අපේක්ෂකයෙකු විභාගයේදී, පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය.

*විෂය නිර්දේශය.-*

(i) *බුද්ධි පරීක්ෂණය* :- කාලය පැය 01 යි, මුළු ලකුණු 100 යි අයදුම්කරුවන්ගේ තර්කන ශක්තිය මැන බැලීම සඳහා අරමුණු කළ ප්‍රශ්න පත්‍රයකි. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.
(ii) *සාමාන්‍ය දැනීම* - කාලය පැය 01 යි. මුළු ලකුණු 100 යි ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් කාලීන සිදුවීම්, නව විද්‍යාත්මක හා තාක්ෂණික සොයා ගැනීම් පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම මැන බැලීම සඳහා අරමුණු කළ ප්‍රශ්න පත්‍රයකි. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විතය.

09.2 සාමාන්‍ය කොන්දේසි :-

(i) මෙම තරග විභාගය සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. ප්‍රශ්න පත්‍ර දෙකටම එකම මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(ii) විභාග ගාස්තුව රු. 500 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(iv) මෙම විභාගය කොළඹදී පමණක් පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(v) *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අයවලුන්ම විභාගයට ඉල්ලා ඇතැයි උපකල්පනය කරමින් සියළුම ඉල්ලුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

*සටහන* :- ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයකි.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(vi) ඉල්ලුම් පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කර ගත යුතු අතර, 1 සිට 6 තෙක් ශීර්ෂ පළමු වන පිටුවට ද, 7 සිට 12 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවටද, ඉතිරිය 3/4 පිටුවලටද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත් ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව හා එම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බව වැඩිදුරටත් දන්වමි. මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කරන්න.

(vii) ඉල්ලුම්පත්‍රය ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම පුවත්පත්වල නිවේදනයක් පල කරනු ඇත.

(viii) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ix) විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය දෙපාර්තමේන්තු ප්‍රධානියා සතුය.

(x) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත්ද, ලියාපදිංචි කල කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(10) *සේවා කොන්දේසි* :
රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. අනෙක් රාජ්‍ය භාෂාව 2007.05.28 දිනැති අංක 7/2007 චක්‍ර ලේඛයට අනුව එහි 1 කණ්ඩයට අයත් ප්‍රවීනතා මට්ටම ලබා ගත යුතුය.

(11) *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :-විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(12) ලිඛිත පරීක්ෂණයෙන් තෝරා ගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම්ව තබා ගත යුතුය. :-

(i) උප්පැන්න සහතිකය;
(ii) උපාධි සහ අනෙකුත් අදාල අධ්‍යාපන සහතික;
(iii) චරිත සහතික 02 ක් (මින් එකක් විශ්ව විද්‍යාලීය ආචාර්යවරයෙකුගෙන් හෝ මහාචාර්යවරයෙකුගෙන් විය යුතුය;
(iv) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික (ඇතොත්);
(v) සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

*සැලකිය යුතුය* :-

(*a*) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.
(*b*) ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(13) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයැදුම්කරුවකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවාද සහතික කරවා ගත යුතුය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියකු/විශ්‍රාම ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(14) අයදුම්පත් හෝ ඒ සම්බන්ධිත අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයාට හැර වෙනත් කිසිම ආයතනයකට, දෙපාර්තමේන්තුවකට හෝ වෙනත් කිසිදු නිලධාරියෙකුගේ නමට නොයැවිය යුතුය.

(15) මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ. (පොදු කොන්දේසිවල 09 ඡේදයේ සඳහන් කරුණු හැර)

ඩී. බී. පී. සුරංජනා විද්‍යාරත්න,
අධ්‍යක්ෂ ජනරාල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

2012 මාර්තු මස 27 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියට බඳවාගැනීමේ විවෘත තරග විභාගය - 2012

Open Competitive Examination for Recruitment to the Post of Statistical Officer- Grade II in the Department of Census and Statistics.

විභාග අංකය : ☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහායි)

විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍ය ☐
(සිංහල-2/දෙමළ-3/ඉංග්‍රීසි -4)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ : Sunil, A. B.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. ස්ථිර ලිපිනය
2.1 :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.3 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය
ස්ත්‍රී - 1
පුරුෂ -0 ☐
(අදාල අංකය කොටුව තුල ලියන්න.)

3.2 උපන් දිනය :-

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

05. ජනවර්ගය (අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න)

| | | | |
|---|---|---|---|
| සිංහල | | ඉන්දියානු දෙමළ | |
| ශ්‍රී ලංකා දෙමළ | | මැලේ | |
| මුස්ලිම් | | වෙනත් | |

06. පදිංචි දිස්ත්‍රික්කය :————.
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

07. ගෙවන ලද ගාස්තුව (කුවිතාන්සියේ ඡායාපිටපත් අයදුම්කරු ලඟ තබාගන්නේ නම් මැනවි.)
මුදල් ගෙවන ලද දිනය :————.
මුදල් :————.

තැපැල් කාර්යාලය :————.
ලදුපත් අංකය :————.

කුවිතාන්සිය නොගැලවෙන සේ එහි දාරයක් මෙහි අලවන්න.

08. එක් එක් භාෂා විෂයයෙන් ලබා ඇති ඉහළම සාමාර්ථයඃ- (විභාගයේ නම සඳහන් කරන්න.)
සිංහල :————.
දෙමළ :————.
ඉංග්‍රීසි :————.

09. අධ්‍යාපන සුදුසුකම් ඃ-
උපාධිය පිළිබඳ විස්තරය

| උපාධිය | ආයතනය | සාමාර්ථය | විෂයයන් | වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |

වෙනත් අධ්‍යාපන සුදුසුකම්

| පාඨමාලාව | ආයතනය | විෂයය විස්තරය |
|---|---|---|
| | | |

10. වෙනත් සුදුසුකම් :————.

11. දැනට නිරත රැකියාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රැකියාවන් :————.

| ආයතනය | තනතුර | සිට | දක්වා | වැටුප (මාසික) |
|---|---|---|---|---|
| | | | | |

12. ඔබ සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලැබුවෙක්ද? එසේ නම් ඒ විස්තර සඳහන් කරන්න.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වුත්, නිවැරදි වූත්, ඒවා බව සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැන ගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් දැන සිටිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන...................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා බවත්, මුදල් ගෙවන ලදුපත අලවා ඇති බවත්, මා ඉදිරියේදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන ලද
නිලධාරියාගේ අත්සන

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක/ආයතනයක සේවය කරන්නේ නම් පහත සඳහන් සහතිකය සමග සිය දෙපාර්තමේන්තු හෝ ආයතන හා ප්‍රධානියාගේ මාර්ගයෙන් අයදුම්පත ඉදිරිපත් කල යුතුය.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

.............................. මහතා/ මහත්මිය/ මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ .......................... වශයෙන් ස්ථිර/ තාවකාලික/ අනියම් සේවකයකු/ සේවිකාවක ලෙස සේවය කරයි. ඔහු/ඇය (අවවාද කිරීමක් හැර) කිසිදු විනය දඬුවමකට ලක්වී නැති බවත්, මෙම අයදුම්පතේ සපයා ඇති තොරතුරුත් නිවැරදි බව සහතික කරමි. ඔහුගේ/ඇයගේ හැසිරීම් හා වැඩ සතුටුදායක වූ බවත්, අදාළ ගැසට් නිවේදනයේ ප්‍රකාර ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමේ සුදුසුකම් සපුරා ඇති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදාහැරිය හැකිය/ නොහැකිය.

————,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

04-423

---

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012

1.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

3.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 *වැටුප* :- අංක 06/2006(IV) 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II, හා I වැනි පන්තිවලට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 13,990 - 10 x 145 - 11 x 170 - 6 x 240 - 14 x 320 - රු. 23,230 වේ. රු. 15,440 න් ඔබ්බට යාම සඳහා II වැනි පන්තියට උසස් වීම ද රු. 17,310 න් ඔබ්බට යාම සඳහා 1 වැනි පන්තියට උසස් වීම ද ලබාගත යුතු ය.

5.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

6.0 *සුදුසුකම්* :- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
(*ඇ*) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
(*ඈ*) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(1) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමර්ථය සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම;

සහ

(2) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර සියලු ම විෂයයන්ගෙන් එකවර සමත් ව තිබීම.

(පැරණි විෂය නිර්දේශය යටතේ විෂය 03 කින් එක්වර සමත් ව තිබීම ප්‍රමාණවත් වේ.)

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2012 මැයි මස 21 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

7.0 දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම.

(*අ*) සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ට අදාළව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා ඇබෑර්තු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

(i) යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ ඇබෑර්තු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කයට අන්තර්ග්‍රහණය කර ගනු නොලැබේ නම් එම ඇබෑර්තු සංඛ්‍යාව පළාත තුළ යාබද දිස්ත්‍රික්කවල නැවත බෙදා හරිනු ලැබේ.

(ii) පත් කිරීමට තිබෙන මුළු තනතුරු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කර ගත නොහැකි වන විට කුසලතා අනුපිළිවෙලින් සුදුස්සන් තෝරනු ලැබේ.

(iii) විභාගයේ දී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

(*ආ*) දිස්ත්‍රික්කයට අයත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම්.—දිස්ත්‍රික්කයක පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් පහත සඳහන් කරුණු අතරින් එකක් හෝ සපුරා තිබිය යුතු ය.

(i) අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ උපන් අයකු විය යුතු ය;

*එසේ නැතහොත්*

(ii) විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයකු විය යුතු ය;

*එසේ නැතහොත්*

(iii) ඔහු නොකඩවා අවුරුදු 05 ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීයික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතු ය.

(*ඇ*) අයදුම්කරුවන් ඉහත (ආ) (ii) යටතේ තමන් අයත් දිස්ත්‍රික්කය සනාථ කිරීම සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න අවුරුදු තුනක (03) ඡන්ද හිමි නාමලේඛන සහ ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කිරීමට බැඳී සිටිය යුතු ය.

*සටහන* - 1. යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් සභා සේවයේ හෝ සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට තමාගේ, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ. (ඒ සඳහා අයදුම්කරු විසින් තම දෙමාපියන්ගේ උප්පැන්න සහතික පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

2. කිසිම අපේක්ෂකයෙකුට එක් දිස්ත්‍රික්කයට වැඩි ගණනක ඇබෑර්තු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. තමන් වඩාත් කැමති දිස්ත්‍රික්කය කවරක් දැයි වරක් සඳහන් කළ පසු එය වෙනස් කළ නොහැකිය.

8.0 පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3% ක් ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයින් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3% ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබාදීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයන්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් 50% ක් වත් විය යුතුය. පත්වීමක් සඳහා තෝරා ගනු ලැබූ අපේක්ෂයෙකු විශේෂ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධ සහිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතුය.

9.0 විභාග පරිපාටිය :-

විභාගය, ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම විභාගය සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | *ලකුණු* | *කාලය* |
|---|---|---|
| (i) භාෂා හැකියාව | 100 යි | පැය 1 1/2 යි |
| (ii) අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි |

*භාෂා හැකියාව.*—මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*අභියෝග්‍යතාව.*—මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතය. සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.)

මෙම විභාගය තරග විභාගයක් වුව ද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක්වත් (40%) අපේක්ෂකයන් විසින් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබාගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

10.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.*—ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

11.0 *විභාග ගාස්තු.*—විභාග ගාස්තුව රු. 500 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 යටතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

12.0 *අයදුම්පත්‍ර.*—ඒ 4(සෙ. මී. 21x29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්,—

(අ) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,
(ආ) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ, අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.
(ඇ) ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

*සැ. යු.*- විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. යම් නගරයකට ඉල්ලුම් කළ අපේක්ෂකයන් ගණන ප්‍රමාණවත් නොවේ නම් දෙවන කැමැත්ත ලෙස සඳහන් කළ නගරය වෙත යොමු කෙරෙන අතර, එම දෙවන නගරය සඳහා ද ප්‍රමාණවත් අපේක්ෂකයින් ගණනක් නොසිටියහොත් යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.

12.1 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012" යන්න සහ ඔබ තරග කරන දිස්ත්‍රික්කය ද සඳහන් කරන්න.

12.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක, විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 2,40,360 ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

12.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2012 මැයි මස 21 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

13.0 *විභාගයට පෙනී සිටීම.*- අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක්ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

14.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. :—

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 අපේක්ෂකයෙකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය. විභාගයට පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට ද විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

බී. පී. පී. එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 05 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012

Open Competitive Examination for Recruitment to Class III of Public Management Assistants' Service - 2012

(දෙන ලද කොටු තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

* ගැසට් නිවේදනය අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න. (විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක සඳහා උපලේඛන - II බලන්න)

| | නගරය | නගර අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |

* පුරප්පාඩු සඳහා තරග කිරීමට ගැසට් නිවේදනයේ 7.0 වැනි ඡේදයට අනුකූලව ඔබ තෝරා ගන්නා දිස්ත්‍රික්කය.
(දිස්ත්‍රික්ක අංක සහිත උපලේඛනය - 1 බලන්න. අදාළ දිස්ත්‍රික්කය හා දිස්ත්‍රික් අංකය කොටුව තුළ ලියන්න)

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්ක අංකය |
|---|---|
| | |

* ඔබ විභාගයට පෙනී සිටින්නේ ගැසට් නිවේදනයේ 8.0 ඡේදයේ ප්‍රකාරව, අබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේ ද?
(මෙම කොටස පිරවීමට පෙර ගැසට් නිවේදනයේ 8.0 ඡේදය හොඳින් කියවන්නේ නම් මැනවි)
ඔව් - 1
නැත - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A. B. C.
1.2 සම්පූර්ණ නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :———.
(සිංහලෙන්/දෙමළෙන්)
1.4 ජාතික හැඳුනුම්පත් අංකය

2.0 2.1 ස්ථිර ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :———.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය - ස්ත්‍රී -1 පුරුෂ -0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

3.3 2012.05.21 දිනට වයස ඃ අවුරුදු : මාස : දින :

3.4 දුරකථන අංකය ඃ

4.0 4.1 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? :———.
4.2 උප දිසාපති/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :———.
4.3 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :———.

5.0 අධ්‍යාපන සුදුසුකම් ඃ
5.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :———.
(ii) විභාග අංකය :———.
(iii) ප්‍රතිඵල

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :———.
(ii) විභාග අංකය :———.
(iii) ප්‍රතිඵල

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.3 පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇත්නම්,

(i) විශ්ව විද්‍යාලය :———.

(ii) උපාධිය :———.

(iii) විභාග වර්ෂය :———.

6.0 වෙනත් සුදුසුකම් :———.

7.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :———.

(ii) ලදුපත් අංකය හා දිනය :———.

(iii) ගෙවූ මුදල :———.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න |
|---|

9.0 *අයැදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

10.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ............... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

———,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :———.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.

තනතුර :———.

ලිපිනය :———.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

## *උපලේඛනය* - I

දිස්ත්‍රික් නාම ලේඛනය හා අංක

| *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික්ක අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මාතලේ | 04 |
| මහනුවර | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| වව්නියාව | 13 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| පුත්තලම | 17 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| පොළොන්නරුව | 20 |
| බදුල්ල | 21 |
| මොණරාගල | 22 |
| කෑගල්ල | 23 |
| රත්නපුර | 24 |
| කිලිනොච්චිය | 25 |

## *උපලේඛනය* - II

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගරයන්

| | *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| 01 | කොළඹ | කොටහේන | 01 |
| | | මරදාන | 02 |
| | | බොරැල්ල | 03 |
| | | කුරුඳුවත්ත | 04 |
| | | බම්බලපිටිය | 05 |

| | | |
|---|---|---|
| | හැව්ලොක් ටවුම | 06 |
| | නුගේගොඩ | 07 |
| | මොරටුව | 08 |
| | පිළියන්දල | 09 |
| | හෝමාගම | 10 |
| | මහරගම | 11 |
| | හංවැල්ල | 12 |
| | අවිස්සාවේල්ල | 13 |
| 02 ගම්පහ | මීගමුව | 14 |
| | මිනුවන්ගොඩ | 15 |
| | දිවුලපිටිය | 16 |
| | වේයන්ගොඩ | 17 |
| | ගම්පහ | 18 |
| | ජා-ඇල | 19 |
| | වත්තල | 20 |
| | කැළණිය | 21 |
| | දොම්පේ | 22 |
| 03 කළුතර | හොරණ | 23 |
| | පානදුර | 24 |
| | කළුතර | 25 |
| | මතුගම | 26 |
| | අලුත්ගම | 27 |
| 04 මාතලේ | මාතලේ | 28 |
| | ගලේවෙල | 29 |
| | නාඋල | 30 |
| | ලග්ගල - පල්ලේගම | 31 |
| 05 මහනුවර | මහනුවර | 32 |
| | කටුගස්තොට | 33 |
| | තෙල්දෙණිය | 34 |
| | වත්තේගම | 35 |
| | නුගවෙල | 36 |
| | ගලගෙදර | 37 |
| | ගම්පොළ | 38 |
| 06 නුවරඑළිය | හැඳුනුවැව | 39 |
| | නුවරඑළිය | 40 |
| | වතුමුල්ල | 41 |
| | හැටන් | 42 |
| | ගිනිගත්හේන | 43 |
| 07 ගාල්ල | අම්බලන්ගොඩ | 44 |
| | ගාල්ල | 45 |
| | බද්දේගම | 46 |
| 08 මාතර | වැලිගම | 47 |
| | මාතර | 48 |
| | කඹුරුපිටිය | 49 |
| | හක්මන | 50 |
| | දෙයියන්දර | 51 |
| | දික්වැල්ල | 52 |
| | අකුරැස්ස | 53 |
| | කොටපොල | 54 |
| 09 හම්බන්තොට | බෙලිඅත්ත | 55 |
| | වලස්මුල්ල | 56 |
| | වීරකැටිය | 57 |
| | තංගල්ල | 58 |
| | අම්බලන්තොට | 59 |
| | හම්බන්තොට | 60 |
| | තිස්සමහාරාමය | 61 |
| 10 යාපනය | චාවකච්චේරිය | 62 |
| | යාපනය | 63 |
| | තෙලිප්පල්ලෙයි | 64 |
| | පේදුරුතුඩුව | 65 |
| 11 මන්නාරම | මන්නාරම | 66 |
| | මුරුක්කන් | 67 |
| 12 මුලතිව් | මුලතිව් | 68 |
| 13 වවුනියා | වවුනියාව | 69 |
| 14 ත්‍රිකුණාමලය | කන්තලේ | 70 |
| | ත්‍රිකුණාමලය | 71 |
| | මුතූර් | 72 |
| | පදවි පරාක්‍රමපුර | 73 |
| | කින්නියා | 74 |
| 15 මඩකලපුව | මඩකලපුව | 75 |
| | එරාවූර් | 76 |
| | කාතන්කුඩි | 77 |
| 16 අම්පාර | අම්පාර | 78 |
| | සේරංකඩ | 79 |
| | කල්මුණ | 80 |
| | අක්කරපත්තු | 81 |
| | සමන්තුරේ | 82 |
| 17 පුත්තලම | වෙන්නප්පුව | 83 |
| | මාදම්පේ | 84 |
| | හලාවත | 85 |
| | පුත්තලම | 86 |
| 18 කුරුණෑගල | කුලියාපිටිය | 87 |
| | බිංගිරිය | 88 |
| | නාරම්මල | 89 |
| | පොල්ගහවෙල | 90 |
| | කුරුණෑගල | 91 |
| | ඉබ්බාගමුව | 92 |
| | දොඩම්ගස්ලන්ද | 93 |
| | මොරතිහ | 94 |
| | නිකවැරටිය | 95 |
| | මහව | 96 |
| 19. අනුරාධපුරය | මැදවච්චිය | 97 |
| | කැකිරාව | 98 |
| | අනුරාධපුරය | 99 |
| | ගලෙන්බිඳුණුවැව | 100 |
| | කහටගස්දිගිලිය | 101 |
| 20 පොළොන්නරුව | පොළොන්නරුව | 102 |
| | හිඟුරක්ගොඩ | 103 |
| 21 බදුල්ල | බණ්ඩාරවෙල | 104 |
| | වැලිමඩ | 105 |

| | | | |
|---|---|---|---|
| | | බදුල්ල | 106 |
| | | පස්සර | 107 |
| | | මහියංගනය | 108 |
| | | ගිරාඳුරුකෝට්ටේ | 109 |
| | | හසලක | 110 |
| 22 | මොණරාගල | බිබිල | 111 |
| | | මොණරාගල | 112 |
| | | වැල්ලවාය | 113 |
| 23 | කෑගල්ල | කෑගල්ල | 114 |
| | | රඹුක්කන | 115 |
| | | මාවනැල්ල | 116 |
| | | රුවන්වැල්ල | 117 |
| 24 | රත්නපුර | ඇහැලියගොඩ | 118 |
| | | රත්නපුර | 119 |
| | | පැල්මඩුල්ල | 120 |
| | | බලංගොඩ | 121 |
| | | කලවාන | 122 |
| | | ඇඹිලිපිටිය | 123 |
| 25 | කිලිනොච්චි | කිලිනොච්චිය | 124 |
| | | පලෙයි | 125 |

04-603

---

## රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින්, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය - 2012

1.0 රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2012 අගෝස්තු මස පත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මධ්‍යම රාජ්‍ය සේවයට අයත් කණිෂ්ඨ සේවකයින් සඳහා මෙම විභාගය පහත සඳහන් නගරවලදී පැවැත්වේ. එම නගර සහ නගරවලට අදාළ නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතුන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයින්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මාතලේ | 04 |
| මහනුවර | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| වව්නියාව | 13 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| පුත්තලම | 17 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| පොළොන්නරුව | 20 |
| බදුල්ල | 21 |
| මොණරාගල | 22 |
| කෑගල්ල | 23 |
| රත්නපුර | 24 |
| කිලිනොච්චිය | 25 |

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 *අයදුම්කරුවන් මෙම විභාගය පෙනී සිටිය යුතු භාෂා මාධ්‍යය.-* මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.0 *වැටුප.-* අංක 06/2006(IV) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II හා I වන පන්තිවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 13,990 - 10 x 145 - 11 x 170 - 6 x 240 - 14 x 320 - රු. 23,230 වේ. රු. 15,440න් ඔබ්බට යාම සඳහා II වන පන්තියට උසස්වීම ද, රු. 17,310න් ඔබ්බට යාම සඳහා I වන පන්තියට උසස්වීම ද ලබාගත යුතු ය.

***සටහන.-*** පත්වීම ලබන අවධියේ ක්‍රියාවේ යෙදෙන වැටුප් වැඩිවීමේ නීතිරීතිවලට යටත්ව, වැටුප් වැඩිවීම් වාසි ලබාදෙනු ලැබේ.

6.0 *සේවා කොන්දේසි :-*

(i) මෙම විභාගයෙන් සාමාර්ථ්‍යය ලබන අයදුම්කරුවන්ට පත්වීමේ දින සිට එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්වීම් දෙනු ලැබේ. ඔවුන්ගේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් අවශ්‍යතාවන් සම්පූර්ණ කළ පසු සේවයෙහි ස්ථිර කිරීම සිදු කරනු ලැබේ.

(ii) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත් කරන ලද අයදුම්කරුවන් ස්ථාන මාරු කිරීමටත්, ලංකාවේ ඕනෑම තැනකට පත් කිරීමටත් යටත් වේ.

(iii) පත්වීම ලැබ වසර 05ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතු ය.

7.0 *පත්වීම සඳහා තෝරාගනු ලබන අන්දම.*- මධ්‍යම රජයේ පුරප්පාඩු සඳහා මධ්‍යම රාජ්‍ය සේවයේ යෙදෙන කණිෂ්ඨ සේවක සේවිකාවන් පමණක් තරග විභාගයට ඇතුළත් කරනු ලැබේ. විභාගයට අදාළ එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු සියයට හතළිහක් (40%) හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අයදුම්කරුවන් තෝරා, ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව කුසලතා පදනම මත තෝරාගනු ලැබේ.

8.0 *යෝග්‍යතාව.*- මෙම විභාගය සඳහා තරග කිරීමට සුදුසුකම් ලැබීම පිණිස සෑම අපේක්ෂක අපේක්ෂිකාවකම;

(i) 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(IV) අනුව පීඑල්-1-2006 ඒ, පීඑල්-2-2006 ඒ, සහ පීඑල්-3-2006 ඒ, වැටුප් කේත අංක යටතේ වන වැටුප් පරිමාණයක් සහිත ස්ථිර පත්වීම් දරන මධ්‍යම රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයකු විය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතු ය. (ආයතන සංග්‍රහයේ I වැනි පරිච්ඡේදයේ දැක්වෙන අර්ථ නිරූපණයකට ඇතුළත් රජයේ සේවකයකු/සේවිකාවක විය යුතු ය.)

(ii) 2012.05.21 දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සක්‍රිය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය.

(iii) 2001.11.26 වන දිනට පසුව සේවයේ ස්ථිර කර ඇති අපේක්ෂකයන් භාෂාව/සාහිත්‍යය හා අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හයක් (06) ඇතිව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් සමත්ව සිටිය යුතු ය.

*සටහන* :

1. යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ හෝ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත (ii) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත (ii) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

2. රජයේ සේවයේ සියලුම මෝටර් රථ රියදුරන්ට, සෙසු සුදුසුකම් තිබේ නම් තම වැටුප් ක්‍රමය කවරක් වුව ද ඒ ගැන නොතකා මෙම තරග විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ.

3. ඉහත (ii) හි සඳහන් අවුරුදු 05ක සතුටුදායක සේවය පහත සඳහන් පදනම මත තීරණය කරනු ලැබේ. පහත සඳහන් අවශ්‍යතාවන් සම්පූර්ණ කර ඇති අය මෙම විභාගයේ කාර්යයන් සඳහා සතුටුදායක සේවයක් ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේ සළකනු ලැබේ.

(අ) 2012.05.21 වැනි දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළදී ලැබෙන සියලුම වැටුප් වර්ධක ලබා තිබීම.

(ආ) 2012.05.21 වැනි දිනට පෙර වර්ෂ 05ක් තුළදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබීම.

4. පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරාගනු ලැබී නම් ඔහු/ඇය මුදාහැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා කැමති විය යුතු ය.

5. අර්ධ කාර්මික කාර්යයන්හි නියුක්තව සිටින්නා වූ හෝ යම් කාර්යයක් සඳහා පුහුණු කර ඇත්තා වූ හෝ රජය විසින් විශේෂ පුහුණුවක් ලබා දී ඇත්තා වූ කවර හෝ ශ්‍රේණියක සේවකයින් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් නොවනු ඇත. නිදර්ශන වශයෙන් ඉංජිනේරු හා කාර්මාන්තශාලා ශ්‍රේණිවල සේවකයින් හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය සේවිකාවන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු නොවනු ඇත. යම් සේවකයකු සුදුසු ද නුසුදුසු ද යන කරුණු පිළිබඳව යම් සැකයක් පහළ වූ විට දී ඒ සම්බන්ධයෙන් අයදුම්කරු/අයදුම්කාරිය, ඔහුගේ/ඇයගේ දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතු අතර එම දෙපාර්තමේන්තුව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඒ සම්බන්ධව විමසිය යුතු ය.

මෙම විභාගයට පෙනී සිටීම සඳහා යම් සේවකයෙකුගේ යෝග්‍යතාව සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් විමසීමේ දී වැටුප් පරිමාණය සහිතව සේවකයාගේ කාර්යයන් පිළිබඳව පූර්ව විස්තරයක් අදාළ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම කාර්යය දැරීම සඳහා අවශ්‍යතාව සපුරා ගැනීමට පුහුණුවක් අයදුම්කරුට/අයදුම්කාරියට ලබාදී ඇත් ද යන වග හා එවැනි පුහුණුවක් වෙතොත් එම පුහුණුවේ ස්වභාවය හා කාලසීමාව ද සඳහන් කළ යුතු ය.

6. රාජ්‍ය සේවයේ තාවකාලික හා අනියම් සේවකයින්, මණ්ඩල සංස්ථා හා එවැනි අංශවල සේවකයින් මෙම විභාගයේ දී තරග කිරීමට සුදුස්සන් නොවනු ඇත.

7. තැපැල් දෙපාර්තමේන්තුවට අයත් ඒකාබද්ධ සේවයේ කණිෂ්ඨ සේවකයින්ට හැර එම දෙපාර්තමේන්තුවේ වෙනත් කිසිම කණිෂ්ඨ සේවකයකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නැත.

8. මෙහි නියමිත සුදුසුකම් තමන් විසින් සපුරා ඇති බවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්කරුවන්/අයදුම්කාරියන් සෑහීමකට පත්විය යුතු ය. මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව විභාගයට ඉදිරිපත්වන අයදුම්කරුවන්/අයදුම්කාරියන් විභාගයේ දී ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුව ද පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

9.0 *අයදුම්පත්* :-

(i) මෙම විභාගයට ඇතුලත්වීමේ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනයට යාකර ඇත. අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක ආරම්භයේ සිට 4.0 තෙක් පළමුවන පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ii) *විභාග ගාස්තු.*- විභාග ගාස්තුව රු. 400කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ 2003-02-13 ආදායම් ශීර්ෂය යටතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු

ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

(iii) අයදුම්පත නිවැරදිව ද පැහැදිලිව ද අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්අකුරින්ම සම්පූර්ණ කොට 2012.05.21 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මාර්ගයෙන් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය.

(iv) අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කරගත යුතු වන අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළයුත්තේ එක් අයදුම්පතක් පමණක් බව ද අයදුම්පතේ ඡායා පිටපත් හෝ ප්‍රගමන පිටපත් නොඑවන මෙන් ද දන්වා සිටිනු ලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

10.0 අයදුම්පතේ අගට යොදා ඇති අත්දමේ සහතිකයක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ලබා දිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වමත්පස ඉහළ කෙලවරේ විභාගයේ නම පැහැදිලිව ලිවිය යුතුය. යම් අයදුම්කරුවකු/අයදුම්කාරියක මෙම ක්‍රියාපිළිවෙත අනුගමනය කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ/ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. 2012.05.21 වැනි දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම සඳහා ස්වකීය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත කල් ඇතුව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්/අයදුම්කාරියන් වෙත දන්වා සිටිනු ලැබේ.

11.0 අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනවා ඇත. ඒ හා සමගම ඒ බැව් සඳහන් පුවත්පත් නිවේදනයක් 'දිනමිණ', 'තිනකරන්, හා 'ඩේලිනිව්ස්' යන පුවත්පත්වල පළවනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශපත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

12.0 විභාගයට ඇතුළත් කර ගැනීම, ඊට යෝග්‍යතාව පිළිගැනීමක් නොවේ. එසේ ඇතුළත් කර ගැනීම පසු අවස්ථාවක දී පිරික්සා බැලීමට යටත් වන්නකි. විභාගයේ දී තරග කිරීමට නුසුදුස්සකු බව පසු අවස්ථාවක දී අනාවරණය වූ අයදුම්කරුවකුගේ/ අයදුම්කාරියකගේ අපේක්ෂකත්වය විභාගයට පෙර, විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයට පසු කවර අවස්ථාවක දී වුවද අවලංගු කරනු ලැබිය හැකිය.

13.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරනු ඇත.

14.0 *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව.-* අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

16.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-* ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

17.0 *විභාග පරිපාටිය.-* විභාග විෂය හා ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ.

| | *විෂය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| (i) | සාමාන්‍ය දැනීම | 100යි | පැය 2යි |
| (ii) | අභියෝග්‍යතා පරීක්ෂණය | 100යි | පැය 1යි |
| | එකතුව | 200යි | |

සාමාන්‍ය දැනුම : (කාලය පැය 02යි)

(i) සාමාජීය, සංස්කෘතික, දේශපාලන හා විද්‍යාත්මක කරුණු පිළිබඳව දැනුම මැනීම.
(ii) දේශීය හා විදේශීය කාලීන සිදුවීම් පිළිබඳ දැනුම මැනීම.
(iii) රජයේ කාර්යාලයක භාවිතා වන සරල කාර්යාල ක්‍රම සහ ඇමතුම් දින පොත, විෂය ගොනු ලේඛනය, වවුචර්, චලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව, මුද්‍රාව හා නාම මුද්‍රාව, තැපැල් මල්ල ආදී කාර්යාල උපකරණ හා ඒවා මැනවින් භාවිතා කිරීම පිළිබඳව අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනුම හා අවබෝධය මැනීම.
(iv) රාජ්‍ය ආයතනවල පවත්වාගෙන යන යහපත් සන්නිවේදන ක්‍රම මනා ලෙස කාර්යාලය හා අවට පරිසරය පවත්වාගෙන යාම, යහපත් ලෙස මහජන සබඳතා පවත්වාගෙන යාම ආදී කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ අවබෝධය හා ආකල්ප මැනීම.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය.

I වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 40යි (විනාඩි 40යි ලකුණු 40යි).

II වන කොටස - සිද්ධියක්, ප්‍රකාශයක් හෝ ඡේදයක් ඇසුරෙන් අසනු ලබන කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 10ක් සහ ව්‍යුහගත ප්‍රශ්න 3ක් (විනාඩි 80යි - ලකුණු 60යි) මෙම කොටසට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතු අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01යි)

(i) සංඛ්‍යා, සරල ගණිත ගැටලු විසඳීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර/වගු සැකසීම.
(ii) සාමාන්‍ය බුද්ධිය හා තර්කන හැකියාව මැනීමේ ප්‍රශ්න.
(iii) අපේක්ෂකයාගේ අදහස් ප්‍රකාශන හැකියාවන්, අවබෝධ කර ගැනීමේ හැකියාව, වාක්‍ය කීපයක අදහස තනි වාක්‍යයකින් ලිවීම, අක්ෂර වින්‍යාසය හා විරාම ලකුණු භාවිතය පරීක්ෂා කිරීම, නිවැරදි ව්‍යාකරණ භාවිතය හා පද පිළිබඳව දැනුම මැනීම සඳහා සකස් කර ඇත.
(iv) දී ඇති තොරතුරු අනුව සරල ලිපියක් කෙටුම්පත් කිරීම, සටහනක් ලිවීම, කෙටි වාර්තාවක් ලිවීම, ආරාධනා පතක් පිළියෙල කිරීම, න්‍යාය පත්‍රයක් සැකසීම පිළිබඳව දැනුම මැනීම සඳහා සකස් කර ඇත.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. කොටස් දෙකම තනි ප්‍රශ්න පත්‍ර ලෙස ලබාදෙනු ඇත.

I කොටස - බහුවරණ ප්‍රශ්න 20යි - (ලකුණු 20යි - විනාඩි 15යි) ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතු ය.

II කොටස - රචනාමය ප්‍රශ්න 03යි - (ලකුණු 80යි - විනාඩි 45යි) අනිවාර්ය ප්‍රශ්න වලින් සමන්විතය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුයි.

*සටහන* :-

(i) සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයකුගේ යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත.

(ii) සෑම ලිඛිත උත්තර පත්‍රයක ම නොපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩු කරනු ලැබේ.

18.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

බී. පී. පී. එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 05 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

☐

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින්, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය - 2012
Limited Competitive Examination for Promotion of Minor Employees of the Public Service to Class III of the Public Management Assistants' Service - 2012

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල - 2
දෙමළ -3 ☐
ඉංග්‍රීසි -4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

(ගැසට් නිවේදනය අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය සඳහන් කරන්න)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :——
——.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA, A. B.
1.2 සම්පූර්ණ නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :———.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 සේවා ස්ථානය හා ලිපිනය :
2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :———.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය - ස්ත්‍රී -1 පුරුෂ -0 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.4 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

4.0 සේවා විස්තරය :
4.1 ඔබ දැනට සේවය කරන ආයතනයේ නම :———.
4.2 එය අයත්වන අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව :———.

4.3 දැනට දරන තනතුරේ පදවි නාමය :———.

4.4 දැනට දරන තනතුරට පත්වූ දිනය :———.

4.5 දැනට දරන තනතුර ස්ථිර ද නැතහොත් තාවකාලික ද යන වග :———.

4.6 දැනට දරන තනතුරෙහි සේවය ස්ථිර කර තිබේ ද යන වග :———.

4.7 සේවය ස්ථිර කර තිබේ නම් ස්ථිර කිරීම සඳහා යෝග්‍යතා ලැබූ දිනය :———.

4.8 දැනට දරන තනතුරේ සේවය ස්ථිර කරමින් නිකුත් කරන ලද ලිපියේ යොමු අංකය හා දිනය :———.

4.9 දැනට ලබන වාර්ෂික වැටුප (ඒකාබද්ධ) :———.

4.10 දැනට දරන පත්වීම විශ්‍රාම වැටුප් සහිත ද යන වග :———.

5.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

i. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :———.

ii. ලදුපත් අංකය හා දිනය :———.

iii. ගෙවූ මුදල :———.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු කිරීමටත්, පත් කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමටත් හැකි බව මම දනිමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

———,

අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන
(දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපිට දී)

දිනය :———.

***සටහන*** **:** තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .......................... මහතා/මහත්මිය/මෙනෙවිය .......................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

———,

සහතික කරන්නාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :———.

පදවි නාමය :———.

ලිපිනය :———.

දිනය :———.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

1. මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන .................................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයකු බව ද,
2. ඔහු/ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද,
3. ඔහු/ඇය ස්ථිර තනතුරක 2012.05.21 වැනි දින වන විට සේවයේ ස්ථිර කරනු ලැබ සිටින බව ද,
4. ස්ථිර තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බව ද,
5. ඔහු/ඇය 2012.05.21 වැනි දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර ඇති බව ද,
6. ඔහු/ඇය මෙම ගැසට් නිවේදනයේ 8.0 වැනි ඡේදයේ නියමිත සීමාවන් ඇතුළත ඇති වැටුප් ලබමින් හෝ වැටුප් ක්‍රමයක සිටින බව ද,
7. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම 2012.05.21 වැනි දිනට පූර්වාසන්න අවුරුදු 05 ඇතුළත සතුටුදායකව පැවැති බව ද,
8. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බව ද,
9. රුපියල් 400ක් වටිනා ලදුපතක් අයදුම්පත්‍රයේ අලවා ඇති බව ද,
10. ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමග හරිවැරදි බලා ඇති බව සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බව ද, මම සහතික කරමි.

———,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :———.

පදවි නාමය :———.

ලිපිනය :———.

දිනය :———.

**සංලක්ෂය :**

(1) දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට නිසි ආකාර බලතල පවරනු ලැබූ මාණ්ඩලික නිලධාරියකු හෝ විසින් පමණක් මෙම සහතිකය අත්සන් කළ යුතු ය. සහතිකයේ අඩංගු කරුණු සෑම අයුරකින්ම නිවැරදි බවට සහතිකය නිකුත් කරන නිලධාරියා සෑහීමකට පත්විය යුතු ය.

(2) යෝග්‍යතාව පිළිබඳව සියලුම අවශ්‍යතාවන් සම්පූර්ණ නොකරන අයදුම්කරුවන් වෙතොත් ඔවුන්ගේ අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් නොකළ යුතු ය.

04-602

## ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියේ උතුරු සහ නැගෙනහිර පළාත්වල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා වන විශේෂ විවෘත තරග විභාගය - 2012

උතුරු සහ නැගෙනහිර පළාත්වල ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III වැනි ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා වන විශේෂ තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනයේ 'සේවයේ' යන පදයෙන් ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය (ශ්‍රී. ලං. ග. සේ.) අදහස් කෙරේ.

1. *විභාග දිනය :*

විභාග කොමසාරිස් ජනරාල් විසින් 2012 අගෝස්තු මස කොළඹ දී හා යාපනයේ දී විභාගය පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

2. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය :

මෙය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

3. *සේවා කොන්දේසි :*

රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, අංක 1670/33 සහ 2010 සැප්තැම්බර් මස 10 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

3.1 මෙම විභාගය මගින් පිරවීමට අපේක්‍ෂා කරන උතුරු සහ නැගෙනහිර පළාත්වල පුරප්පාඩු සංඛ්‍යාව 63කි.

3.2 තෝරාගනු ලබන අය පත්වීම් දින සිට අවම වශයෙන් දස අවුරුද්දක් උතුරු සහ නැගෙනහිර පළාත්වල සේවය කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඔවුන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

3.3 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

3.4 විශේෂ විභාගයෙන් බඳවා ගනු ලබන නිලධාරින් ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරින් සඳහා වූ 1 වන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගයට අමතරව වර්ෂ 05ක් ඇතුළත සිංහල භාෂා පරීක්‍ෂණයකින් සමත් විය යුතු ය. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා විධිවිධාන අනුව)

4. *වැටුප හා මාසික වැටුප් පරිමාණය :*

2006.04.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි එස්.එල්.1-2006 වැටුප් කාණ්ඩය අනුව,

*මාසික වැටුප් පරිමාණය :*

SL 1-2006 - රු.22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු.53,555/-

5. *සුදුසුකම් :*

(අ) *අධ්‍යාපන සුදුසුකම් :*

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍යය, කළමනාකරණ, ගණකාධිකරණ, ආර්ථික විද්‍යා යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ උපාධියක් ලබා තිබීම ;

හෝ

(ii) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියෙකු විය යුතු ය ;

හෝ

(iii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් ගණකාධිකාරි ආයතනයක ආවසරික හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී සිටිය යුතු ය ;

හෝ

(iv) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරිත්ව ආයතනයක් මගින් පවත්වන පිරිවැය සහ කළමනාකරණ පරීක්ෂණයේ I හා II වැනි කොටස් හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී සිටිය යුතු ය ;

හෝ

(v) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ ගණකාධිකරණ ආයතනයේ I වැනි වෘත්තීය මට්ටමේ හෝ වඩා උසස් මට්ටමක පරීක්ෂණයකින් සමත් වී සිටිය යුතු ය ;

හෝ

(vi) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ වරලත් සංගමයේ I වැනි II වැනි කොටසට අයත් පරීක්ෂණය හෝ ඊට ඉහළ පරීක්ෂණයකින් සමත් වී සිටිය යුතු ය ;

හෝ

(vii) එක්සත් රාජධානියේ ලේකම්වරුන්ගේ හා පරිපාලකයින්ගේ වරලත් ආයතනයේ අවසාන පරීක්ෂණය;

හා

(viii) උතුරු නැගෙනහිර පළාත්වල රාජකාරි කටයුතු කිරීම සඳහා දෙමළ භාෂාව කථා කිරීමට මනා නිපුනත්වයක් තිබීම සමග අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස සමත් වී තිබිය යුතුය.

(ආ) *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

(ඇ) *වෙනත් සුදුසුකම් :* මේ සඳහා පෙනී සිටින අපේක්‍ෂකයෙකු,

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) විවෘත තරග විභාගය සඳහා දෙවරකට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තෙකුට අවසර නොමැත.
(iv) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
(v) සේවයට පත්කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලැබීමට අයදුම්කරු, 5 (අ) ඡේදයෙහි සඳහන් සුදුසුකම් 2012.04.20 දිනට (නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට) සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර, සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) *වයස :*

2012.04.20 වැනි දිනට (නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට) වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

6. *විභාග ගාස්තු :*

විභාගය සඳහා වූ ගාස්තුව රු. 300 කි. මෙම ගාස්තුව විභාග ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පළමුව ආදායම් ශීර්ෂ 2003-02-13 යනුවෙන් බැර කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට ගෙවිය යුතු ය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාල කොටුවෙහි ඇලවිය යුතු ය. ලදුපතෙහි ඡායාපිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ලඟ තබා ගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

7. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට යාකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කරමින් ඒ-4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතු ය.

(ආ) ඉල්ලුම්පතේ අංක 01 සිට 04 දක්වා මුල් පිටුවේ සඳහන් කළ යුතු ය. ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන්ම පිරවිය යුතු ය. කෙසේ වෙතත් ඉල්ලුම්පත්‍රය සකස් කරනවිට එහි ශීර්ෂය දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ. (12 ඡේදය බලන්න)

(ඇ) විභාගය සඳහා වූ ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2012.05.18 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන පිණිස පැලවත්ත, බත්තරමුල්ලේ පිහිටි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්ට එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙලවරේ "ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියේ උතුරු සහ නැගෙනහිර පළාත්වල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා වන විශේෂ විවෘත තරග විභාගය - 2012" යනුවෙන් පැහැදිලි ලෙස ලිවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

(ඉ) ඉල්ලුම්පත්‍ර ලත් බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ විගසම පුවත්පත්වල දැන්වීමක් පළ කරනු ලැබේ. විභාග දිනට දින හතකටවත් කලින් ප්‍රවේශපත්‍ර නොලබන අපේක්ෂකයෙකු පහත සඳහන් විස්තර ඇතිව වහාම පැලවත්ත, බත්තරමුල්ලේ පිහිටි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්ට දැන්විය යුතු ය. (විදුලි පණිවුඩ සඳහා "විභාග" පැලවත්ත) :—

(i) විභාගයේ නම;
(ii) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම;
(iii) ලිපිනය;
(iv) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි අංකය සහ තැපැල් කාර්යාලය.

(ඈ) විභාගය ඉල්ලුම්කරන අවස්ථාව වනවිට පැවැති අයදුම්කරුගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

8. *විභාගයට ඇතුළත්වීම :*

(අ) අදාල විභාග ගාස්තු ගෙවා, නිසි ලෙස ඉල්ලුම්පත් සම්පූර්ණ කර, නියමිත දිනට පෙර එවා ඇති සියලුම ඉල්ලුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාල ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතු ය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළ කර ඇත.

(ඇ) අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනුලබන තීරණවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

9. *අපේක්ෂකයාගේ අනන්‍යතාව :*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ඇත. :-

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;

(ආ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමින් යටපත් කර ඇති නම්, ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. මෙම රෙගුලාසිවල සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

12. *විභාග ක්‍රමය :*

*විභාග මාධ්‍යය :* විභාගය, දෙමළ මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

13. *පරීක්ෂා කිරීමේ ක්‍රමය :*

(අ) *පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත විභාගයක්.—*

| | | | |
|---|---|---|---|
| (i) | මූල්‍ය ගණකාධිකරණය I වැනි පත්‍රය | - කාලය පැය 03යි | - ලකුණු 100 |
| (ii) | මූල්‍ය ගණකාධිකරණය II වැනි පත්‍රය | - කාලය පැය 03යි | - ලකුණු 100 |
| (iii) | පිරිවැය හා කළමනාකරණ ගණකාධිකරණය | - කාලය පැය 03යි | - ලකුණු 100 |
| (iv) | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | - කාලය පැය 03යි | - ලකුණු 100 |
| (v) | විගණනය හා විමර්ශනය | - කාලය පැය 03යි | - ලකුණු 100 |
| (vi) | සාමාන්‍ය බුද්ධිය හා අවබෝධය | - කාලය පැය 03යි | - ලකුණු 100 |

විෂය නිර්දේශයන් මෙම නිවේදනය අවසානයේ දැක්වේ.

(ආ) *සම්මුඛ පරීක්ෂණය :*

ලිඛිත ප්‍රශ්නපත්‍රවලින් එක් එක් විෂයය සඳහා අවම වශයෙන් 40% ක ප්‍රතිශතයක් ලබා ඇත්තා වූ අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව, අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගයේ දී ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා අදාළ පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

15. *පත් කිරීම පිණිස තෝරා ගැනීමේ ක්‍රමය :*

විභාගයට ලිඛිත පරීක්ෂණවලින් ඉහළම ලකුණු ලබා ගෙන ඇති කුසලතා අනුපිළිවෙල අනුව හා මූලික සුදුසුකම් සපුරා ඇති අය තෝරා ගනු ලැබේ. අපේක්ෂකයින් කිහිප දෙනෙකුට එකම ලකුණු ලැබී ඇත්නම් තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පී.ඒ.අබේසේකර,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

2012 අප්‍රේල් මස 20 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

අයදුම්පත

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ උතුරු සහ නැගෙනහිර පළාත්වල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා වන
විශේෂ විවෘත තරග විභාගය - 2012

SPECIAL OPEN COMPETITIVE EXAMINATION FOR FILLING
GRADE III VACANCIES OF THE SRI LANKA ACCOUNTANTS' SERVICE IN NOTHERN AND EASTERN PROVINCES - 2012

| විභාග අංකය :<br>(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) | |
|---|---|
| *විභාගයට පෙනී සිටින නගරය* | *එම නගර අංකය* |
| | |
| ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න.<br>(කොළඹ - 1, යාපනය - 2)*<br>නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. | |
| විභාගයට පෙනී සිටින මාධ්‍යය :<br>දෙමළ - 3<br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න) | ☐ |

1.0 නම : 1.1 මුලකුරු සමග නම : Mr./Mrs./Miss.:———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

*උදා :* Mr. SILVA, A. B.

1.2 සම්පූර්ණ නම :————.
(දෙමළෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.0 ස්ථිර ලිපිනය :————.
(දෙමළෙන්)

2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 අයදුම්පත් එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව : විවාහක - 1, අවිවාහක - 2
(අදාළ අංකය තුළ ලියන්න)

3.3 ජාතික හැඳුනුම්පත් අංකය :

3.4 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

3.5 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : මාස : දින :

4.0 නිවේදනයේ 5 ඡේදය යටතේ මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකු වීම පිණිස ලැබූ සුදුසුකම් :————.

5.0 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීම සඳහා වූ මීට පෙර පැවැත් වූ විභාගයට ඔබ පෙනී සිටි වර්ෂ සඳහන් කරන්න :

1. ————.
2. ————.
3. ————.

6.0 මුදල් කුවිතාන්සිය නොගැලවෙන ලෙස අයදුම්පතට අලවන්න.

(ලදුපත නොගැලවෙනසේ මෙහි අලවන්න)
ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබාගන්න.

(i) අංකය :————. (iii) මුදල් ගෙවූ ස්ථානය :————.

(ii) දිනය :————. (iv) ගෙවන ලද මුදල : රුපියල් :————.

7.0 අයදුම්කරුගේ සහතිකය :

7.1 මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තුව ගෙවන ලද අංක .............................. හා ............................ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත්, ප්‍රකාශ කරමි. තව ද, විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසු හෝ මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ......................................................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් ................................ දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන).

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————. (නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)
දිනය :————.

*සටහන.*—සහතික කරන අය සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයෙකු, නොතාරිස්වරයෙකු හෝ වසරකට රු.2,40,360 කට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විය යුතුය.

### 1 වැනි පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ උතුරු නැගෙනහිර පළාත්වල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා වන විශේෂ තරග විභාගයේ විෂය නිර්දේශ පිළිබඳ විස්තර :

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ. :—

| *අංකය* | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|---|
| 1 | මූල්‍ය ගණකාධිකරණය - I | 100 | 40 | පැය 03යි. |
| 2 | මූල්‍ය ගණකාධිකරණය - II | 100 | 40 | පැය 03යි. |
| 3 | පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකරණය | 100 | 40 | පැය 03යි. |
| 4 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 100 | 40 | පැය 03යි. |
| 5 | විගණනය හා විමර්ශනය | 100 | 40 | පැය 03යි. |
| 6 | සාමාන්‍ය බුද්ධිය හා අවබෝධය | 100 | 40 | පැය 03යි. |

*විෂය නිර්දේශයන් :*

විෂයය අංක 01 හා 02 - මූල්‍ය ගණකාධිකරණය I හා II

මූල්‍ය ගණකාධිකරණයේ අභිප්‍රාය; සහ

ගිණුම් භාවිතා කරන්නන් හා ඔවුන්ට අවශ්‍ය වන තොරතුරු.

*ගිණුම්කරණ පිළිවෙත :*

ගිණුම් සමීකරණය, ද්විත්ව සටහන් පොත් තැබීම හා ගිණුම් ක්‍රම, මූලික සටහන් පොත් හා ලෙජර්, ශේෂ පිරික්සුම, සමුච්චිත පූර්ව ගෙවීම් හා ගැලපුම්, ප්‍රාග්ධන හා ආදායම් වියදම්, ක්ෂය වීම්, අවිනිශ්චිත ගිණුම් හා වරද නිවැරදි කිරීම, පාලන ගිණුම, සැසඳුම් ප්‍රකාශන, අසම්පූර්ණ වාර්තා.

*අවසාන ගිණුම් :*

නිෂ්පාදන ගිණුම්, වෙළඳ ලාභලාභ ගිණුම්, ශේෂ පත්‍රය, අරමුදල් ගැලීම් ප්‍රකාශනය සහ විසර්ජන ගිණුම.

*හවුල් ව්‍යාපාර ගිණුම් :*

හවුල් ව්‍යාපාර ගිවිසුම්, හවුල් ව්‍යාපාර හා සම්බන්ධ පොත් තැබීම පිළිබඳ කරුණු, ස්ථාවර ප්‍රාග්ධන ගිණුම්, ජංගම ගිණුම්, ණය ගිණුම්,

ආපසු ගැණුම් ගිණුම, හවුල් අවසාන ගිණුම් පිළියෙල කිරීම, හවුලක සංයුතියේ වෙනස්කම් - හවුල්කරුවන් ඇතුළත් කර ගැනීමේ දී හා ඉවත් කිරීමේදී කීර්තිනාමය හා අනිකුත් වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් කටයුතු කිරීම, හවුල් විසුරුවා හැරීම, බද්ධ ව්‍යාපාර.

*සීමාසහිත සමාගම්වල ගිණුම් :*

සීමාසහිත සමාගම්වල ස්වභාවය, නිල ලැයිස්තුගත සමාගම හා කොටස් වෙළඳ පොළ/කොටස් හා ණය ප්‍රාග්ධනය, බෙදිය හැකි ලාභ, අභ්‍යන්තර හා බාහිර ප්‍රයෝජනය සඳහා අවසාන ගිණුම්, ගිණුම් ප්‍රකාශ අර්ථකථනය, ගිණුම් කට්ටලයක් විවරණය කිරීම, ගිණුම් අනුපාතයන්.

*විශේෂිත ගනුදෙනු සඳහා ගිණුම් :*

සමිති හා සමාගම්, තොග, ශාඛා, කුලී සින්නයට මිලදී ගැනීම හා ණයට විකිණීම, කල් බදු දීම, ආයෝජන, විනිමය බිල්පත්, දීර්ඝ කාලීන කොන්ත්‍රාත්තු, රාජ්‍ය භාග, හිස් භාජන ගිණුම්, විදේශ මුදල් ගනුදෙනු

*ගිණුම්කරණය සඳහා පරිගණක යොදා ගැනීම :*

පරිගණක වර්ග/දෘඩාංග හා මෘදුකාංග, පරිගණක කාර්ය බද්ධ මෘදුකාංග, විද්‍යුත් කාරක විස්තර පත්‍රය, පරිගණකමය ගිණුම්කරණය.

**විෂයය අංක 03 - පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකරණය :**

පිරිවැය ගණකාධිකරණය, මූල්‍ය ගණකාධිකරණය හා කළමනාකරණ ගණකාධිකරණය,
පිරිවැය ගණකාධිකරණයේ අභිප්‍රාය,
ගණකාධිකරණය කළමනාකාරීත්ව සහායක් වශයෙන් යොදා ගැනීම.

*ද්‍රව්‍ය පිරිවැය :*

මිල දී ගැනීම් පිළිවෙත්, ගබඩා පිළිවෙත්, ද්‍රව්‍ය නිකුත් කිරීම ඇගයීමේ ක්‍රම, දිරි දීමනා හා ප්‍රසාද දීමනා.

*ශ්‍රම පිරිවැය :*

වේලා සටහන් කිරීම් හා වේලා වෙන් කිරීම්, වැටුප් ගෙවීම් ක්‍රම, දිරි දීමනා හා ප්‍රසාද මුදල් ගෙවීම, වේතන හා වැටුප් ගිණුම් තැබීම.

*පොදු කාර්ය පිරිවැය :*

වර්ගීකරණ වෙන් කිරීම් හා බෙදා හැරීම්, අවශෝෂණ ක්‍රම, පොදු කාර්ය පරිපාලනය, වෙළඳාම් හා බෙදා හැරීම් පොදු කාර්ය පිරිවැය.

*ඒකාබද්ධ හා ඒකාබද්ධ නොවන ගිණුම් :*

පිරිවැය පාලන ගිණුම, පිරිවැය හා මූල්‍ය ගිණුම් සැසඳීම්, පූර්ණ ගිණුම්.

*පිරිවැයකරණ ක්‍රම :*

කොන්ත්‍රාත් පිරිවැයකරණය, කාර්ය පිරිවැයකරණය, දෙපාර්තමේන්තුමය පිරිවැයකරණය, භාණ්ඩ පිරිවැයකරණය, ක්‍රියාවලි පිරිවැයකරණය, ඒකක පිරිවැයකරණය, සේවා පිරිවැය-කරණය, විවිධ පිරිවැයකරණ ක්‍රම යටතේ උපලබ්ධි නොවූ ලාභ.

*ආන්තික පිරිවැයකරණය :*

දායකවීම්/විකුණුම්, සමච්ඡේදන සටහන්, ආන්තික පිරිවැයකරණය යොදා ගැනීම, ආන්තික පිරිවැයකරණය හා සම්බන්ධ ගිණුම් සටහන්.

*ප්‍රමිති පිරිවැයකරණය :*

ප්‍රමිති පිරිවැය, තථ්‍ය පිරිවැය, මූලික විචල්‍යයන්, ගිණුම්කරණ පරිපාටිය.

*අයවැය පාලනය :*

ශ්‍රිතගත අයවැය, ප්‍රධාන අයවැය, නම්‍ය අයවැය පාලනය, අඛණ්ඩ අයවැයකරණය, අයවැය පාලනය මෙහෙයුම.

**විෂයය අංක 04 - රාජ්‍ය මූල්‍ය කළමනාකරණය :**

*රජයේ මුදල් පිළිබඳ නෛතික රාමුව :*

ඒකාබද්ධ අරමුදල, විශේෂ නීති විෂයගත වියදම්, ප්‍රතිශ්චිත අවසාන අරමුදල, රාජ්‍ය ණය, විදේශ ආධාර, මූල්‍යමය පියවර.

*කාර්යභාරය :*

පාර්ලිමේන්තුවේ, මුදල් අමාත්‍යවරයාගේ, භාණ්ඩාගාරයේ, විගණකාධිපතිවරයාගේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ, ප්‍රධාන ගණක නිලධාරියාගේ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ, මුදල් මණ්ඩලයේ -

*වාර්ෂික විසර්ජන කෙටුම්පත :*

අයවැය ක්‍රමය හා පටිපාටි/වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු.

*අයවැය ක්‍රියාත්මක කිරීම :*

අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධාන ව්‍යුහය, ආදායම් රාශිකරණ පටිපාටිය, ගෙවීම් කිරීම සඳහා අග්‍රිමය, මූල්‍ය කටයුතු මෙහෙයුම් අධීක්ෂණය, කාර්ය පැවරුම, වීරමොං පටිපාටිය, පරිපූරක ඇස්තමේන්තු, අයවැය පාලනය, සැපයීම් පටිපාටිය.

*රජයේ ගිණුම් ක්‍රමය හා පටිපාටි :*

රජයේ දේපළ භාරය, ආරක්ෂාව හා පාලනය, ආදායම් හා අනිකුත් ලැබීම් සඳහා ගිණුම්කරණය, වියදම් හා අනිකුත් ගෙවීම් සඳහා ගිණුම්කරණය, විදේශ ආධාර සඳහා ගිණුම්කරණය, පාඩු අත්හැරීම් හා කපා දැමීම් සඳහා ගිණුම්කරණය.

*සමාලෝචනය :*

ක්ෂණික වාර්තා, මාසික ගිණුම් සාරාංශය, මූල්‍ය හා භෞතික කාර්යය සාධන සමාලෝචනය, වාර්ෂික විසර්ජන ගිණුම, දිවයිනේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව, රජයේ ගිණුම් කාරක සභාවේ වාර්තාව, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ වාර්තාව.

**විෂයය අංක 05 - විගණනය හා විමර්ශනය :**

*විගණනයේ ස්වභාවය හා පරමාර්ථය - විගණකගේ කාර්යභාරය :*

අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය, ව්‍යවස්ථාපිත - ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා 1971 අංක 38 දරන මුදල් පනත යටතේ රජයේ දෙපාර්තමේන්තුවලට, අමාත්‍යාංශවලට හා සංස්ථාවලට අදාළව ව්‍යවස්ථාමය නොවන - 1982 අංක 17 දරන සමාගම් ආඥාපනත යටතේ, විගණන ප්‍රමිති, විගණන මත, විගණන සංකල්ප, විගණකගේ ස්වාධීනත්වය හා අනිකුත් පෞද්ගලික ගුණාංග, සාක්ෂි, සත්‍යවාදී සාධාරණ බව, භෞතිකත්වය, විගණන අවදානම්, විගණකගේ වගකීම්, විගණනයට භාජිතගේ වගකීම්.

*විෂය ක්ෂේත්‍රය හා සීමාවන් :*

විෂය ක්ෂේත්‍රය නිර්ණය කිරීම, උපකල්පනයන් හා සීමාවන්.

*විගණන ප්‍රමිතිවල හා මාර්ගෝපදේශවල කාර්යභාරය :*

සේවයේ යෙදීමේ ලිපිවල, කළමනාකරණ ලිපිවල හා නියෝජන ලිපිවල කාර්යභාරය, මූලික විගණන ක්‍රම විධි හා සමාලෝචනය සඳහා පටිපාටි අභ්‍යන්තර පාලනය ඇගයීම.

ප්‍රමාණ සටහන්, ප්‍රශ්න මාලා

*විගණන සැලසුම් කිරීම් හා පාලනය :*

විගණනය සැලසුම් කිරීම, කාල නිර්ණය, අන්තර් හා අවසාන විගණන, කාර්යයන් සඳහා වගකීම් භාරදීම, විගණන පාලනය, අභ්‍යන්තර පාලනය යොදා ගැනීම් ඇතුළුව කල වැඩ සටහන්ගත කිරීම, සකස් කළ ප්‍රශ්න මාලා හා අභ්‍යන්තර පාලනය ඇගැයීමේ ආකෘතිපත්‍ර

*මූල්‍ය විගණනය සඳහා අගයන්, සංකල්ප හා ලක්ෂණ :*

එය රාජ්‍ය අංශයට අදාළ බව, විශ්ලේෂණාත්මක විගණනය

පරිගණකගත කළ ගිණුම් පද්ධති විගණනය - සීමාසහිත සමාගම් විගණනය

ව්‍යවස්ථාපිත පොත්, අධ්‍යක්ෂවරුන්ගේ බලතල හා රාජකාරීන්, බෙදිය හැකි ලාභ, විගණකයින් පත් කිරීම, වේතන හා ඉවත් කිරීම්, නව විගණකයන් භාර ගැනීමට ප්‍රථම ගත යුතු ක්‍රියාමාර්ග, විගණකගේ බලතල හා යුතුකම්

*පරීක්ෂණවල ස්වභාවය හා ප්‍රමාණය :*

අනුකූලතා පරීක්ෂණ, ස්වාධීන පරීක්ෂණ, නියැදි ශිල්ප ක්‍රම, ශේෂ පත්‍ර සමීක්ෂණය, ආදායම් හා වියදම් ගිණුම් සමීක්ෂණය

*විගණකයින්ගේ හා ගණකාධිකාරීවරුන්ගේ වෘත්තීමය වගකීම් :*

වෘත්තීමය පැවැත්ම හා ආචාර ධර්ම, නෛතික අයිතීන් හා වගකීම්, ගණකාධිකාරීගේ හා විගණකගේ නීතිමය වගකීම හා සිද්ධීන් පිළිබඳ දැනුම් විෂයයට අදාළ නීතිය

*විමර්ශන :*

විමර්ශනයට අදාළ විෂය ක්ෂේත්‍රයේ සැලසුම් කිරීම, භාවිතා කළ යුතු ශිල්ප ක්‍රම හා පිළිවෙත්, විමර්ශන මෙහෙයවීමේ අභිප්‍රාය පිළිබඳ උදාහරණ, සක්‍යතා අධ්‍යන, මිලට ගැනීම්, විකිණීම, ණයට දීමේ, මිල නියම කිරීම ආදිය සඳහා ව්‍යාපාර ආයතන ඇගයීම, කාර්ය පත්‍රය සඳහා ගණකාධිකාරීගේ හා විගණකගේ වාර්තා, වාර්තාකරණ කාර්යයන්, වංචා විමර්ශන, ව්‍යාපෘති ඇගැයීම.

*වාර්තාකරණ කාර්යයන් :*

අභ්‍යන්තර පාලන පද්ධතිවල දුර්වලතා කළමනාකරණයට වාර්තා කිරීම, රජයේ හා සංස්ථා විගණනයට ලිඛිතව විශේෂ වාර්තාකරණය කාර්යය, කාර්ය පත්‍රය සඳහා වාර්තා, විමර්ශනය පිළිබඳ වාර්තා.

**විෂයය අංක 06 - සාමාන්‍ය බුද්ධිය හා අවබෝධය**

*'අ'* කොටස : අවබෝධය

අවබෝධය ප්‍රශ්න පත්‍රයේ දෙනු ලබන ඡේදයක් පදනම් කොටගෙන අයදුම්කරුවන්ගෙන් ප්‍රශ්න අසනු ලැබේ. තවත් ඡේදයක් දෙනු ලබන අතර, අයදුම්කරුවන් විසින් එහි මුඛ්‍ය අදහස ඡේදයේ වචන ගණනින් තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලිවිය යුතුය.

*'ආ'* කොටස : සාමාන්‍ය බුද්ධිය

පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් අයැදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධකර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. (බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.).

*සටහන :*

(i) ඉහත (ආ) සහ (ඇ) හි ඇති "සුදුසුකම් ලත් විභාගය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ 5 වැනි ඡේදයෙහි දක්වා ඇති විභාගවලින් එකක්ය.
(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය.
(iii) තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

04-605

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**ඉස්ලාම් ආගමික අහදිය්‍යා අල් කුර්ආන් පාසල් සඳහා වූ අවසන් සහතික පත්‍ර විභාගය - 2011**

(බෞද්ධ දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය හා සමාන විභාගයකි.).

*නීතිරීති හා ව්‍යවස්ථා :*

1. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ඉහත සඳහන් විභාගය, 2012 ජූලි මාසය තුළ පැවැත්වීමට කටයුතු යොදා ඇත. එම විභාගය සඳහා වූ විෂය නිර්දේශ, ඇමුණුම 01 හි සඳහන් වේ.

2. *විභාග මධ්‍යස්ථාන :*

එක් එක් දිස්ත්‍රික්කයෙන් පෙනී සිටීමට නියමිත අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව ඇමුණුම 02හි සඳහන් නගරවල විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ.

එහෙත් යම්කිසි විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර එම අයදුම්කරුවන් ඊට ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ.

3. *භාෂා මාධ්‍යය* :
මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

4. *සුදුසුකම්* :
මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ සම්පූර්ණ කර තිබිය යුතුය. :-

4.1 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද අහදිය්‍යා දහම් පාසලක 10 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන අයකු වීම;

හෝ

4.2 මුස්ලිම් ආගමික හෝ සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද අල්කුර් ආන් මද්‍රසා විෂය නිර්දේශය සම්පූර්ණ කරන ලද අයකු වීම;

හෝ

4.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අ. පො. ස. (සා. පෙළ) විභාගයේ ඉස්ලාම්, අරාබි විෂයයන්ගෙන් සාමාර්ථ්‍යය ලත් අයකු වීම.

*සටහන* :

1. මෙම විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු ම ඉහත 4 වැනි ඡේදයේ සඳහන් කර ඇති සුදුසුකම් ලබා ඇති බවට අහදිය්‍යා දහම් පාසලේ විදුහල්පති හෝ අල්කුර් ආන් මද්‍රසාවේ ජ්‍යෙෂ්ඨ විදුහල්පති හෝ පාසලේ විදුහල්පති හෝ සහතික කළ යුතු වේ.

2. සෑම අයදුම්කරුවකු ම මෙම විභාගයට ලියාපදිංචි කළ අහදිය්‍යා පාසල හෝ ජ්‍යෙෂ්ඨ අල් කුර්ආන් මද්‍රසාවේ හෝ පාසලේ විදුහල්පති හෝ මගින් පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

5. ලියාපදිංචි කළ සියලු ම අහදිය්‍යා දහම් පාසල්, මද්‍රසා පාසල් වෙත ඉල්ලුම්පත් හා උපදෙස් පත්‍රිකා තැපැල් මගින් යවා ඇති අතර, එසේ නොලැබුණු ආයතන වෙතොත් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට අයදුම්කරුවන් සංඛ්‍යාව සඳහන් කළ ලිපියක් 2012 මැයි මස 14 වැනි දිනට පෙර එවීමෙන් අයදුම්පත්‍ර හා උපදෙස් පත්‍රිකා ලබාගත හැක.

5.1 සියලුම ඉල්ලුම්පත් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුල් පිටපත විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු අතර, අනෙක් පිටපත අදාළ ආයතනයේ ගොනුකර තැබිය යුතුය.

5.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය 2012 මැයි මස 18 වැනි දින වේ.

5.3 ඉල්ලුම්පත් පැහැදිලි ව හා නිවැරදිව සම්පූර්ණ කළ යුතු වේ. එසේ නොවන ඉල්ලුම්පත් හා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු වේ. :-
විභාග කොමසාරිස් ජනරාල්,
(සංවිධාන හා විදේශ විභාග ශාඛාව),
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

5.5 ඉල්ලුම්පත් ලැබුණු බව දැනුම් දෙනු නොලැබේ.

5.6 ඉල්ලුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ''ඉස්ලාම් ආගමික අහදිය්‍යා අවසාන සහතික පත්‍ර විභාගය - 2011'' යනුවෙන් හා ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතුය.

5.7 ඉල්ලුම්පත්‍ර සමග කිසිදු සහතිකයක් අමුණා එවිය යුතු නැත. අහදිය්‍යා දහම් පාසලේ හෝ මද්‍රසාවේ විදුහල්පති හෝ පාසලේ විදුහල්පති හෝ ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය නියමිත සුදුසුකම් ලබා ඇති බව සහතික කළ යුතුය.

6. පළමුවැනි වරට මෙම විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අයකරනු නොලැබේ. පළමුවැනි වරට පසු සම්පූර්ණ විභාගයටම පෙනී සිටින අයදුම්කරුවන් විභාග ගාස්තු වශයෙන් රුපියල් 150 ක් ගෙවිය යුතුය. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා වන විෂයයට රුපියල් 50 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතුය.

*විභාග ගාස්තු ගෙවන ආකාරය* :

නියමිත මුදල දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.).

7. *ප්‍රවේශ පත්‍ර* :
විභාග කොමසාරිස් ජනරාල් විසින් අදාළ අහදිය්‍යා විදුහල්පති වෙත හෝ මද්‍රසා විදුහල්පති වෙත හෝ පාසලේ විදුහල්පති වෙත හෝ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

7.1 යම්කිසි විභාග අයදුම්කරුවකු විභාගයට පෙනී සිටින පළමුවැනි දිනයේ තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද විභාග මධ්‍යස්ථානය හැර වෙනත් මධ්‍යස්ථානයක විභාගයට පෙනී සිටීමට තැත් කළහොත් අදාළ අයදුම්කරුගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.2 ප්‍රවේශ පත්‍රයේ ඇති ඉල්ලුම්කරුගේ අත්සන අහදිය්‍යා දහම් පාසලේ විදුහල්පති හෝ මද්‍රසා විදුහල්පති හෝ අරාබි විදුහලේ විදුහල්පති හෝ රජයේ සේවයේ යෙදී සිටින රුපියල් 2,40,360 කට වඩා වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ නිලධාරියකු හෝ මස්ජිද් භාර ඉමාම් යන අයගෙන් කෙනකු හෝ විසින් සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින හතකට (07) පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අහදිය්‍යා පාසල්වල හෝ මද්‍රසා පාසල්වල විදුහල්පතිවරු මේ පිළිබඳව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දිය යුතුය. එවැනි සෑම අවස්ථාවක දී ම පහත සඳහන් කරුණු දැනුම් දිය යුතුය :-

(අ) විභාගයේ නම,
(ආ) අහදිය්‍යා පාසල්/කුර්ආන් මද්රාසා/රජයේ පාසලේ නම,
(ඇ) සම්පූර්ණ නම හා ලිපිනය,
(ඈ) ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය,
(ඉ) ඉල්ලුම් පත්‍රය යැවූ තැපැල් කාර්යාලය,
(ඊ) ලියාපදිංචි කළ දිනය හා අංකය.

8. *අනන්‍යතාව තහවුරු කිරීම* :
සියලු ම අයදුම්කරුවන් විභාගයට පෙනී සිටින සෑම අවස්ථාවක දීම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන ආකාරයට තමන්ගේ අනන්‍යතාව ඔප්පු කළ යුතුය.

9. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා සමත් බව සහතික කිරීම* :

9.1 මෙම විභාගය සඳහා නියමිත විෂයයන් ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකු ම එම විෂයයන් හතරෙන් ම සමත් විය යුතුය.

9.2 එක් වතාවක දී අදාළ විෂය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් ඌන සාමාර්ථ්‍යයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී වසර දෙකක් (02) ඇතුළත එම ඌන සාමාර්ථ්‍යය ලැබූ විෂයයට පමණක් නැවත පෙනී සිට, එය සමත් වී, ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කළ යුතුය. (මෙය 2011 වසරට අදාළ විභාගයේ සිට බලපැවැත් වේ.)

9.4 එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු සියයක් (100) හිමි වේ. මෙහි දී ලබාදෙන එක් එක් ශ්‍රේණි සඳහා අදාළ ලකුණු පරාස පහත පරිදි වේ. :—

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

9.5 *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම* :
විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර අදාළ ආයතන ප්‍රධානීන් වෙත තැපැල් මගින් දන්වා යවනු ලැබේ.

10. *සහතික පත්‍ර* :
විභාගයෙන් සාමාර්ථ්‍යය ලබන සියලුම අයදුම්කරුවන්ට සහතික පත්‍ර නිකුත් කරනු ලැබේ.

11. *ප්‍රතිඵල නැවත සමීක්ෂණය* :
විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළහැකිය. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයක් මගින්, නියමිත ගාස්තු ගෙවා අදාළ ආයතනයේ විදුහල්පති මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. විභාග ප්‍රතිඵලවල වෙනසක් සිදුවුවහොත් පමණක් ගාස්තු ආපසු ගෙවනු ලැබේ. කවර හෝ හේතුවක් මත ඉල්ලුම්කරුට හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයකුට හෝ උත්තර පත්‍ර නිරීක්ෂණයට අවසර දෙනු නොලැබේ.

12. ඉහත සඳහන් කොන්දේසි හා උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට සියලු ම අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි සඳහන් නොවූ කරුණු සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණ ගනු ලැබේ.

ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර,
විභාග කොමසාරිස් ජනරාල්.

2012 මාර්තු මස 29 වැනි දින,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

ඇමුණුම - 01

***විභාගය සඳහා වූ විෂයයන් හා විෂය නිර්දේශය***

මෙම විභාගයට අයත් එක් එක් ප්‍රශ්න පත්‍රයක් පැය තුනක කාලයක් සඳහා සකස් කර ඇති අතර, එවැනි ප්‍රශ්න පත්‍ර හතරක් විභාගයට අයත් වේ. ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ ප්‍රශ්නයන්ට ලකුණු වෙන් කරන ආකාරය අංක 1358 හා 2004.09.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයේ සඳහන් පරිදිම සිදු කෙරේ.

*පළමුවැනි ප්‍රශ්න පත්‍රය* :

1. අකීදා සහ ෂරීආ (ඉස්ලාම් සිද්ධාන්ත හා මූලිකාංග) සහ ආරාබි භාෂාව :

1.1 අකීදා පොදු පැහැදිලි කිරීම් (අල් ඉලාහියියාත්, අන්නුබුව්වත්, අර්රූහානියත්, අස්සම් ඉය්යාත්)

1.2 අකීදාවේ කොටස් :
+ අහ්ලුස්සුන්නා වල්ජමා අත්හි අකීදා
+ අනිකුත් අකීදා කොටස් කිහිපයක් : ජබරිය්යා, කදිරිය්යා, මුර්ජියා, මුඃතසිලා, ෂියා

1.3 තෞහිද් හා ෂිර්ක්කු :
+ ඊමාන් හා කුෆ්රු
+ රිද්දත්, නිෆාක්
+ අල්කුර්ආණය පහළ කර එය සම්පාදනය කරන ලද ආකාරය පිළිබඳ ඉතිහාසය
+ නීති මූලධර්මයන් වශයෙන් අල්කුරාණයේ උපයෝජනය
+ සුන්නාවේ බිහිවීම හා එය සම්පාදනය කළ ඉතිහාසය
+ නෛතික මූලධර්ම වශයෙන් සුන්නාවේ උපයෝජනය
+ හදීස් කලා ඉතිහාසය හා ප්‍රධාන මුහද්දීස්වරුන්ගේ දායකත්වය
+ ඉජ්තිහාද් පිළිබඳ විස්තර
+ ආධාරක මූලධර්මයන් වශයෙන් ඉජ්මා
+ ආධාරක මූලධර්මයන් වශයෙන් කියාස්
+ ෆික්හයේ ඉතිහාසය හා ප්‍රධාන ඉමාම්වරු

1.4 අරාබි භාෂාව :
+ හැඩහුරු සහිතව ලිවීම
+ කුඩා වාක්‍යයන් ලිවීම
+ ඉස්ලාම් විෂයයට අදාළ අරාබි වචන ලිවීම
+ ප්‍රධාන සූරා, ආයත්, හදීස් ආදිය නිවැරදිව ලිවීම

*දෙවැනි ප්‍රශ්න පත්‍රය* :

2. අල්ෆික්හුල් ඉස්ලාම් (ඉස්ලාමීය නීති පද්ධතිය)

2.1 ඉබාදත් පිළිබඳ විස්තර :
+ ඉබාදතයේ කොටස්
+ තහාරත්

2.2 නජීසය හා එහි කොටස් :
+ නජීසය පිරිසිදු කිරීමේ ක්‍රම
+ ජලය හා එහි වර්ග
+ වුදූ, තයම්මුම්, ස්නානය පිළිබඳ පවතින ක්‍රියාදාමයන්

2.3 සකාත් :
+ වැදගත්කම
+ විධි හා ක්‍රම
+ එක්රැස් කිරීම හා බෙදා හැරීම
+ සකාත් මගින් දිළිඳුකම තුරන් කිරීම සහ සම්පත් බෙදීම

2.4 නෝම්බිය (උපවාසය) :
+ වැදගත්කම
+ විධි ක්‍රම හා ප්‍රයෝජනය

2.5 හජ් :
+ වැදගත්කම
+ විධි ක්‍රම හා ප්‍රයෝජන

2.6 හජ් ඉටු කරන ක්‍රමය :
+ පරලු වාජිබ් සුන්නත්
+ පරලු හජ් යට අමතරව ඉටුකරන හජ්

2.7 ඉස්ලාම්හි ආහාර, ඇඳුම්, වාසස්ථාන පිළිබඳ අවධානය හා ක්‍රියාදාමයන්

2.8 ජිහාත් පිළිබඳ පැහැදිලි කිරීම

2.9 කුර්බානි හා කැපුම් ක්‍රමයන්

2.10 දිව්රුම හා භාරවීම

2.11 මුආමලාත් පිළිබඳ විස්තර :
+ ඉපයීමේ වැදගත්කම
+ ප්‍රධාන ගණුදෙනු (වෙළඳාම)
+ අනිකුත් ගණුදෙනු (උදා. : තාවකාලිකව ඉල්ලා ගැනීම, බදු ගැනීම
+ වක්පු, වසීය්යත්, වරාසත්, (පොදු දේපළ, බුදල් දේපළ, පරම්පරා දේපළ)

2.12 ඉස්ලාම්හි ස්ත්‍රී පුරුෂ තත්ත්වයන් :
+ නිකාහයේ විධි හා ප්‍රයෝජන
+ පවුල් ජීවිතය
+ අඹුසැමියන්
+ දෙමාපිය, දූදරු අයිතිවාසිකම් හා යුතුකම්
+ තලාක් හා ඉද්දා

2.13 ජිනායත් :
+ හුදූද්, කියාස්, තඃසීර්

තුන්වන ප්‍රශ්න පත්‍රය :

3. සීරා හා තාරිකු :

3.1 ඉස්ලාමයට පෙර වූ අරාබි රටේ සමාජ ආගමික තත්ත්වයන්
3.1.1 නබි(සල්) තුමා
+ නුබුව්වතයට පෙර ජීවිතය
+ පවුල, පරම්පරාව
+ තරුණ විය
+ උතුම් ගුණාංග
+ විවාහය

+ නුබුව්වත් හා හිජ්රත් අතර ජීවිතය
+ නුබුව්වත් ලැබීම
+ ඉස්ලාමික ප්‍රචාරයන් හා එහි ප්‍රතිඵල
+ මිඃරාජ්
+ හිජ්රත්

+ මදීනා ජීවිතය
+ සමාජ දේශපාලන ක්‍රියාකාරකම්
+ ආත්මාරක්ෂා යුද්ධයන් හා සාම ගිවිසුම්
+ ඉස්ලාම් සම්පූර්ණවීම
+ සහාබාවරුන්ගේ තත්ත්වයන් හා ඉස්ලාමය වෙනුවෙන් එතුමන්ලාගේ දායකත්වයන්
+ කුලපාඋර්රා සීදූන් යන අයගේ ඉතිහාසය හා දේශපාලන දායකත්වයන්
+ උමය්යා අබ්බාසිය්යා පාලනකාලය
+ බයිතුල් මුකද්දසයේ ඉතිහාසය
+ ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා දායකත්වය
+ විද්‍යාත්මක දැනුමට මුස්ලිම්වරුන්ගේ දායකත්වය
+ පහත සඳහන් අය පිළිබඳ ඉතිහාසය :-
+ ඉමාම් බුහාරි (රහ්)
+ ඉමාම් ෂාපිඊ (රහ්)
+ ඉමාම් ගස්සාලි (රහ්)
+ ඉමාම් අබ්දුල් කාදර් ජීලාන් (රහ්)
+ ඉමාම් ෂාදුලි (රහ්)

හතරවන ප්‍රශ්න පත්‍රය :

4. අක්ලාක් - (ඉස්ලාම් සාරධර්මය)

4.1 අක්ලාක් පිළිබඳ ඉස්ලාමයේ අවධානය :
+ අක්ලාක් පිළිබඳ විස්තර
+ ඊමාන් සහ අක්ලාක් අතර පවතින සම්බන්ධතාවය
+ අක්ලාක් හා ඉබාදත් අතර තිබෙන සම්බන්ධතාවය
+ හෘද පවිත්‍රත්වය (ඉක්ලාස්)

4.2 තක්වා :
+ වරඋසුහ්ද්
+ මුරාකබා, මුහාසබා
+ ෂවුක් (දේවකරුණාව)

4.3 දන්දීම :
+ කැපවීම
+ කෘතඥභාවය
+ ඉවසීම, හික්මීම, ඉඩදීම, සමාවීම
+ බැගෑපත්වීම
+ කාලය අගය කිරීම
+ අවයවයන් රැකගැනීම කට, ඇස, කණ, ලිංගික අංගයන්
+ අන් අයට ගෞරව කිරීම
+ යුක්තිය හා අවංකභාවය
+ තරුණ තරුණියන් අතර දක්නට ලැබිය යුතු වැදගත් සදාචාර ගුණාංගයන්
+ අනිකුත් ආගමික අය අතර වූ සහජීවනය

4.4 ඉස්ලාම් නීති පද්ධතිය :

ඇමුණුම 02

අදාළ දිස්ත්‍රික්කවල විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට බලාපොරොත්තුවන නගර හා නගර අංක

| නගරය | නගර අංකය | දිස්ත්‍රික් අංකය |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය : | | 01 |
| මැද කොළඹ | 01 | |
| බම්බලපිටිය | 02 | |

| නගරය | නගර අංකය | දිස්ත්‍රික් අංකය |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කය : | | 02 |
| තිහාරිය | 03 | |
| මාබෝල | 04 | |
| මල්වාන | 05 | |
| මීගමුව | 06 | |
| කල්එළිය | 07 | |
| කළුතර දිස්ත්‍රික්කය : | | 03 |
| පානදුර | 08 | |
| කළුතර | 09 | |
| අලුත්ගම | 10 | |
| ගාල්ල දිස්ත්‍රික්කය : | | 04 |
| ගාල්ල | 11 | |
| මාතර දිස්ත්‍රික්කය : | | 05 |
| වැලිගම | 12 | |
| මාතර | 13 | |
| හම්බන්තොට දිස්ත්‍රික්කය : | | 06 |
| හම්බන්තොට | 14 | |
| කෑගල්ල දිස්ත්‍රික්කය : | | 07 |
| මාවනැල්ල | 15 | |
| වරකාපොල | 16 | |
| කන්නත්තොට | 17 | |
| කුරුණෑගල දිස්ත්‍රික්කය : | | 08 |
| කුලියාපිටිය | 18 | |
| කුරුණෑගල | 19 | |
| මැල්සිරිපුර | 20 | |
| පොල්ගහවෙල | 21 | |
| කැකුණගොල්ල | 22 | |
| පුත්තලම දිස්ත්‍රික්කය : | | 09 |
| නොරොච්චෝලෙයි | 23 | |
| පුත්තලම | 24 | |
| හලාවත | 25 | |
| අනුරාධපුර දිස්ත්‍රික්කය : | | 10 |
| අනුරාධපුර | 26 | |
| කැකිරාව | 27 | |
| ගලෙන්බිඳුණුවැව | 28 | |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය : | | 11 |
| කදුරුවෙල | 29 | |
| මාතලේ දිස්ත්‍රික්කය : | | 12 |
| මාතලේ | 30 | |
| මහනුවර දිස්ත්‍රික්කය : | | 13 |
| මහනුවර | 31 | |
| නාවලපිටිය | 32 | |
| දෙල්තොට | 33 | |
| ගෙලිඔය | 34 | |
| නුවරඑළිය දිස්ත්‍රික්කය : | | 14 |
| නුවරඑළිය | 35 | |
| රත්නපුර දිස්ත්‍රික්කය : | | 15 |
| ඇහැලියගොඩ | 36 | |
| බලංගොඩ | 37 | |
| බදුල්ල දිස්ත්‍රික්කය : | | 16 |
| බදුල්ල | 38 | |
| වැලිමඩ | 39 | |
| මොණරාගල දිස්ත්‍රික්කය : | | 17 |
| බිබිල | 40 | |
| අම්පාර දිස්ත්‍රික්කය : | | 18 |
| අක්කරෙයිපත්තුව | 41 | |
| පොතුවිල් | 42 | |
| කල්මුනේ | 43 | |
| සමන්තුරේ | 44 | |
| ඉරක්කාමම් | 45 | |
| නින්දවූර් | 46 | |
| ඔලුවිල් | 47 | |
| මඩකලපුව දිස්ත්‍රික්කය : | | 19 |
| කාත්තාන්කුඩි | 48 | |
| එරාවූර් | 49 | |
| වාලච්චේන | 50 | |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය : | | 20 |
| මුතූර් | 51 | |
| කින්නියා | 52 | |
| ත්‍රිකුණාමලය | 53 | |
| වවුනියාව දිස්ත්‍රික්කය : | | 21 |
| වවුනියාව | 54 | |
| මන්නාරම දිස්ත්‍රික්කය : | | 22 |
| මන්නාරම | 55 | |
| මුලතිවු දිස්ත්‍රික්කය : | | 23 |
| මුලතිවු | 56 | |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය : | | 24 |
| කිලිනොච්චි | 57 | |
| යාපනය දිස්ත්‍රික්කය : | | 25 |
| යාපනය | 58 | |

04-546

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2011 (2012)**

අංක 1751 දරන 2012 මාර්තු මස 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද "ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 111 වැනි පන්තියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2011 (2012)" නිවේදනයේ 3 වගන්තිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග මත පහත සඳහන් වන පරිදි සංශෝධනය කෙරේ. :-

3. වගන්තිය

*පත්කරනු ලබන සංඛ්‍යාව*

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ පවතින පුරප්පාඩු 114 ක් විවෘත බඳවා ගැනීම් මගින් සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

*පත්වීම් ක්‍රියාත්මක වන දිනය*

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

මෙම *ගැසට් නිවේදනයේ* ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 2012.04.23 දින වන අතර *ගැසට් නිවේදනයේ* සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පී. බී. අබේකෝන්,<br>
ලේකම්,<br>
රාජ්‍ය පරිපාලන සහ<br>
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 05 වැනි දින,<br>
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,<br>
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

04-601

**ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය

සමෘද්ධි සංවර්ධන නිලධාරි I/II වැනි ශ්‍රේණිවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය — 2011 (2012)

සමෘද්ධි අධිකාරියේ ඉහත සේවාවල නිලධාරීන් සඳහා පැවැත්වෙන එකී විභාගය සම්බන්ධව 2012.02.24 වැනි දින පලකරන ලද 1747 අංක දරන *ගැසට් නිවේදනයේ* විභාග අයදුම්පත් භාරගන්න වූ අවසාන දිනය 2012.03.23 ලෙස සඳහන් කර තිබුණි.

02. එහෙත් විභාග අයදුම්කරුවන්ගේ ඉල්ලීම මත විභාග අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2012.04.30 වැනි දින දක්වා දීර්ඝ කරන ලද බව සඳහන් කරමි.

ආර්. පී. බී. තිලකසිරි,<br>
අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,<br>
04 වැනි මහල,<br>
සෙත්සිරිපාය,<br>
බත්තරමුල්ල.

04-473

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.